# SLAASMB

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන
ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

**ඉහළ විශ්වාසනීයත්වයක් උදෙසා**

## වාර්ෂික වාර්තාව '16

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය,
1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති
පනත මගින් සංස්ථාපනය කරන ලදී.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්* විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ඉදිරිපත් කිරීමේදී හා විගණනය කිරීමේදී, ශ්‍රී ලංකා ගිණුම් හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට එකඟව ක්‍රියාකරන බවට අධීක්ෂණය කිරීම මණ්ඩලයේ කාර්යභාරය වේ.
*(58 පිටුව බලන්න.)

# පටුන


මණ්ඩලයේ සාමාජිකයින්.......... 1

මණ්ඩලයේ සාමාජිකයින් 2016 දෙසැම්බර් 31 දිනට.......... 2

මණ්ඩලයේ ආරාධිතයින් 2016 දෙසැම්බර් 31 දිනට.......... 5

කාර්ය මණ්ඩලය.......... 6

තාක්ෂණික කාර්ය මණ්ඩලය.......... 7

ක්‍රියාකාරකම් සමාලෝචනය 2016.......... 8

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණය මණ්ඩලය ශක්තිමත් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා 2016 ජාතික අයවැය මගින් පරිපූරක අයවැය යටතේ වෙන් කරන ලද අරමුදල් උපයෝගී කර ගැනීම.......... 15

2016 වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ නිරීක්ෂණ.......... 19

2016 වර්ෂයේදී ලබාගත් එකඟතාවයන්.......... 21

2016 වර්ෂයේදී සමාලෝචනය කරන ලද ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලවූ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය ලැයිස්තුව.......... 22

2016 වර්ෂයේදී සමාලෝචිත මූල්‍ය ප්‍රකාශන අතරින් නිරීක්ෂණ සහිතව අනුකූල වූ, නිරීක්ෂණ ලිපි මගින් දැනුම් දෙන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් ලැයිස්තුව.......... 28

2016 දෙසැම්බර් 31 දිනට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකරන ලද ලැයිස්තුගත සමාගම් සහ රාජ්‍ය ආයතන.......... 32

2016 වසර තුළ විගණන සමාලෝචන වලදී කරන ලද නිරීක්ෂණ.......... 33

කාර්ය සාධන ලකුණු පත.......... 38

විගණකාධිපති වාර්තාව.......... 40

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.......... 47

මූල්‍ය කාර්යසාධනය හා අනෙකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය.......... 48

ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය.......... 49

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.......... 50

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්.......... 51

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්.......... 58

# මණ්ඩලයේ සාමාජිකයින්

| | | |
|---|---|---|
| පි වී එල් නන්දසිරි *FCA, B.Sc. (Public Admin), LLB, FTII, AIB*<br>අධ්‍යක්ෂ නීති හා අනුකූලතා ශ්‍රී ලංකා මහ බැංකුව | සභාපති<br>(2017 අප්‍රේල් 30 දක්වා) | |
| ආර් ඒ ඒ ජයලත් *FCA, B Com (Sp) , MBA MA Econ (Kansas - USA)*<br>සහකාර මහ බැංකු අධිපති | (2017 ජූනි 30 දින සිට) | |
| ඩී එන් ආර් සිරිවර්ධන *B.A.(Hons), LLB, Attorney-at-Law*<br>සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් | නිල බලයෙන් | |
| කේ දහනායක මිය *B.Com (Sp), PGDM, M.pub mgp., FTII*<br>දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | නිල බලයෙන්<br>(2017 ජූනි 22 දක්වා) | |
| ඩී එම් එල් අයි දිසානායක *B. Sc. (B. Admin) (sp), Dip. in English - SLIDA*<br>දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | (2017 ජූනි 30 දින සිට) | |
| වී පී විජේගුණවර්ධන *MA, BA(Hons)*<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | නිල බලයෙන් | |
| එල් එල් එස් වික්‍රමසිංහ *FCA, FMAAT*<br>හවුල්කරු බී. ආර් ද සිල්වා සහ සමාගම<br>සභාපති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | නම් කල නියෝජිත | ශ්‍රී.ලං.ව.ග.ආ. |
| ඒ හේරත් *FCA, B.Sc., MBA, MAFE,*<br>හවුල්කරු අර්නස්ට් සහ යංග්,<br>හිටපු සභාපති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | නම් කල නියෝජිත | ශ්‍රී.ලං.ව.ග.ආ. |
| ඩබ් ඩබ් ජේ සී පෙරේරා *FCA, B.Sc. (B. Admin), CFE*<br>හවුල්කරු කේ පී එම් ජී | නම් කල නියෝජිත | ශ්‍රී.ලං.ව.ග.ආ. |
| එස් එන් ජයසිංහ *FCMA (UK)*<br>සමූහ මූල්‍ය අධ්‍යක්ෂ සිලෝන් බිස්කට් සමූහ සමාගම | නම් කල නියෝජිත | එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය (ශ්‍රී ලංකා) |
| පී එල් සී පීරිස් *FCA, Attorney-at-Law*<br>පාලන හවුල්කරු පී එල් සී ලෝ චේම්බර්ස් | නම් කල නියෝජිත | ශ්‍රී ලංකා නීතිඥ සංගමය |
| එන් සිවප්‍රගාසම් මෙනෙවිය *FCA, FCMA (UK)*<br>ප්‍රධාන මූල්‍ය නිලධාරී එයිට්කන් ස්පෙන්ස් සමාගම | නම් කල නියෝජිත | ලංකා වාණිජ මණ්ඩලය |
| ඒ ඩී වාස් ගුණසේකර *FCA, FSCMA*<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මූල්‍ය, සම්පත් බැංකුව | නම් කල නියෝජිත | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය |
| එම් ඩී පී එල් පෙරේරා මිය *FCA, MBA (Fin.)*<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය | මණ්ඩලයේ ලේකම් | |

★ *ශ්‍රී ලංකා කර්මාන්ත හා වාණිජ මණ්ඩල සම්මේලනය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නියෝජනය කරන එක් සාමාජිකයෙකු බැගින් මණ්ඩලයට පත්කිරීමට නියමිතව ඇත.*

# මණ්ඩලයේ සාමාජිකයින්
## 2016 දෙසැම්බර් 31 දිනට



**පි වී එල් නන්දසිරි**
*B.Sc.,(Pub.Admin.) LLB, FCA, FTII, AIB*

2015 වසරේ ජුනි මස සිට 2017 අප්‍රේල් දක්වා මණ්ඩලයේ සභාපතිවරයා ලෙස කටයුතු කරන ලද නන්දසිරි මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාවේ. ඔහු ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අනුකූලතා නිලධාරියා ද වන අතර එහි වසර 28 කට අධික කාලයක් සේවයකර ඇත. බැංකු හා මූල්‍ය නියාමනය සහ ගිණුම්කරණය පිළිබඳ මනා පලපුරුද්දක් ඇත.



**ඩී එන් ආර් සිරිවර්ධන**
*B.A. (Hons) LLB, Attorney-at-Law,*

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස කටයුතු කරන සිරිවර්ධන මහතා සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ වසර 28 කට අධික කාලයක් සේවයකර ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නිල බලයෙන් පත්වූ කවුන්සල සාමාජිකයකු ද වේ.



**කේ දහනායක මහත්මිය**
*B.Com (Sp), PGDM, M.pub.mgp,FTII*

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් ලෙස කටයුතු කරන කේ. දහනායක මහත්මිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වසර 35 කට අධික කාලයක් සේවයකර ඇත. ඇය ශ්‍රී ලංකා බදු ආයතනයේ අධිසාමාජිකාවක් වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (රාජ්‍ය අංශ) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ද වේ.



**වී පී විජේගුණවර්ධන**
*BA(Hons), MA*

වී.පී. විජේගුණවර්ධන මහතා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කරයි. ඔහු ලන්ඩනයේ විනිමය හා ආයෝජන ආයතනයෙන් ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපල සුදුසුකම් ලබා ඇත. ඔහු වසර 10 කට අධික කාලයක් ආයෝජන විශ්ලේෂණ හා අරමුදල් කළමනාකරණය පිළිබඳ කටයුතු කර ඇති අතර ප්‍රාග්ධන වෙළඳපල ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම සඳහා ගත් ප්‍රධාන ක්‍රියාමාර්ගයන් සඳහා නායකත්වය ලබා දී ඇත.




මණ්ඩලයේ සාමාජිකයින්
2016 දෙසැම්බර් 31 දිනට




**එල් එල් එස් වික්‍රමසිංහ**
*FCA, FMAAT*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන වික්‍රමසිංහ මහතා ආසියා පැසිපික් ගණකාධිකාරී සම්මේලනයේ හා දකුණු ආසියා ගණකාධිකාරී සම්මේලනයේ මණ්ඩල සාමාජිකයකු ලෙස ද සේවය කරයි. තවද ඔහු දකුණු ආසියා ගණකාධිකාරී සම්මේලනයේ විනිවිදබාවය විශ්වාසනීයත්වය හා පාලනය නගා සිටුවීමේ කමිටුවේ සභාපතිධූරය හොබවන අතර දැනට ජාත්‍යන්තර ගණකාධිකරණ සම්මේලන මණ්ඩලයේ සභාපතිවරයාගේ තාක්‍ෂණික උපදේශක ලෙස සේවය කරයි. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.



**ඒ හේරත්**
*BSc. MBA, MAFE, FCA*

මාලදිවයිනේ හා ශ්‍රී ලංකාවේ අර්නස්ට් සහ යංග් සමාගමේ ජ්‍යේෂ්ඨ හවුල්කරුවකු වන හේරත් මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හිටපු සභාපතිවරයාවේ. ඔහු ජාත්‍යන්තර ගණකාධිකාරී සම්මේලනයේ වෘත්තිය ගණකාධිකරන සංවිධාන නගා සිටුවීමේ කමිටුවේ සාමාජිකයකු වන අතර ආසියා පැසිපික් ගණකාධිකාරී සම්මේලනයේ සාමාජිකත්වය ද දරයි. ඔහු බොහෝ සංස්ථාපිත ආයතනයන්හි අධ්‍යක්ෂවරයකු ලෙසත් නියාමන ආයතන හා ව්‍යවස්ථාපිත කමිටුවල සාමාජිකයකු ලෙසත් සේවය කරයි.



**ඩබ්ලිව් ඩබ්ලිව් ජේ සී පෙරේරා**
*B.Sc(B.Admin.), FCA, CFE*

මාලදිවයිනේ හා ශ්‍රී ලංකාවේ කේ පී එම් ජී ආයතනයේ හවුල්කරුවකු වන පෙරේරා මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ නියෝජ්‍ය සභාපතිවරයාවේ. ඔහු දකුණු ආසියා ගණකාධිකාරී සම්මේලනයේ සුළු හා මධ්‍ය පරිමාණ වෘත්තීය කමිටුවේ හා වෘත්තීය ආචාරධර්ම සහ ස්වාධීන කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කරන අතර ආසියා පැසිපික් ගණකාධිකාරී සම්මේලනයේ රාජ්‍ය අංශ මූල්‍ය කළමනාකරණ කමිටුවේ සාමාජිකයකු ලෙසද කටයුතු කරයි. ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ සහතිකලත් වංචා විමර්ශකයින්ගේ සංගමයේ සහතිකලත් වංචා විමර්ශකයකු ද වේ.



**එස් එන් ජයසිංහ**
*FCMA (UK)*

මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 26 කට අධික කාලයක පලපුරුද්දක් ලබා ඇති එස්. එන්. ජයසිංහ මහතා සිලෝන් බිස්කට් සමූහ සමාගමේ සමූහ අධ්‍යක්ෂ මූල්‍ය ලෙස සේවය කරයි. ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ගෝලීය මණ්ඩලයේ වසර තුනක කාලයක් සේවයකර ඇති අතර වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ශ්‍රී ලංකා ශාඛාවේ හිටපු සභාපතිවරයෙකු ද වේ. දැනට ඔහු ශ්‍රී ලංකා කර්මාන්ත සංගමයේ සභාපතිවරයා වන අතර ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ ප්‍රධාන කමිටුවේ ද සේවය කරයි.

# මණ්ඩලයේ සාමාජිකයින්
## 2016 දෙසැම්බර් 31 දිනට



**පී එල් සී පීරිස්**
*FCA, Attorney-at-Law*

පීරිස් මහතා පී එල් සී ලෝ චේම්බර්ස් ආයතනයේ පාලන හවුල්කරු ලෙස සේවය කරයි. ඔහු මූල්‍ය හා ආයෝජන බැංකුකරණය පිළිබඳව වසර 21 කට අධික කාලයක පලපුරුද්දක් ලබා ඇත. නීතිය හා මූල්‍ය පිළිබඳ විද්වතෙකු වන ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අවසන් පරීක්ෂණයෙන් ද සමත් වී ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පාලක සභාවේ සාමාජිකයකු ලෙස දැනට කටයුතු කරන ඔහු ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නීතිඥ සභාවේ නියෝජිත සාමාජිකයකු ද වේ.



**එන් සිවප්‍රගාසම් මෙනෙවිය**
*FCA, FCMA (UK)*

සිවප්‍රගාසම් මෙනෙවිය එයිට්කන් ස්පෙන්ස් සමාගම් සමූහයේ ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය ලෙස කටයුතු කරන අතර එම සමාගම් සමූහයට අයත් සමාගම් කීපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක ලෙස ද සේවය කරයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මූල්‍ය වාර්තාකරන පීඨයෙහි සභාපතිනිය වන ඇය ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ කවුන්සලයේ හා වෙනත් නියාමන ආයතන හා කමිටුවල ද සේවය කරයි.



**ඒ ඩී වාස් ගුණසේකර**
*FCA, FSCMA*

ගුණසේකර මහතා සම්පත් බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) ලෙස කටයුතු කරයි. ඔහු වසර 22 කට අධික කාලයක සේවා පලපුරුද්දක් ලබා ඇති අතර මෙයින් වසර 17 ක කාලයක් බැංකු හා රක්ෂණ අංශයේ ජ්‍යේෂ්ඨ සංස්ථාපිත කළමනාකරණ මට්ටමේ සේවය කර ඇත. ඔහු හැටන් නැෂනල් බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී, එච් එන් බී ඇෂුවරන්ස් ආයතනයේ සාමාන්‍යාධිකාරී (මූල්‍ය හා සංස්ථාපිත සේවා), එෂියන් එලායාන්ස් මූල්‍ය සමාගමේ මූල්‍ය කළමනාකරු සහ ෆින්ලේස් සමාගමේ ගණකාධිකාරී ලෙස ද සේවය කර ඇත.

**මණ්ඩලයේ නිරීක්ෂක - භාණ්ඩාගාර නියෝජිත**



**එම් ආර් වී ආර් මීපුර**
*MBS, Bsc HRM, ACA*

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන මීපුර මහතා රාජ්‍ය අංශයේ වසර 18 කට අධික කාලයක සේවා පලපුරුද්දක් ලබා ඇත. ඔහු හලාවත වැවිලි සමාගමේ හා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස ද ක්‍රියා කරයි.



# මණ්ඩලයේ ආරාධිතයින්
## 2016 දෙසැම්බර් 31 දිනට

**ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපති**



**ඩී ටී එස් එච් මුදලිගේ**
*FCA, FCCA, FCPA*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හිටපු සභාපතිවරයෙකු වන මුදලිගේ මහතා ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් ශ්‍රී ලංකා සමාගමේ හවුල්කරුවෙකුවේ. ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි ගිණුම්කරණ වෘත්තියේ වසර 26 කට අධික කාලයක පලපුරුද්දක් ලබා ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශන කමිටුවේ උපසභාපතිවරයා ලෙස හා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු ලෙස ද කටයුතු කර ඇත.

**ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිති කමිටුවේ සභාපති**



**එස්. රාජපක්ෂ**
*MBA, FCA*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හිටපු සභාපතිවරයෙකු වන රාජපක්ෂ මහතා බී.ඩී.ඕ. පාර්ට්නර්ස් ආයතනයේ පාලන හවුල්කරු වේ. ලැයිස්තුගත සමාගම් කීපයක අධ්‍යක්ෂ සහ විගණන කමිටු සභාපති ලෙස ක්‍රියාකරන ඔහු ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ කවුන්සිල සාමාජිකයකු ද වේ.

**අධ්‍යක්ෂ ජනරාල්**



**ඩබ්ලිව් ජේ කේ ගීගනගේ මෙනෙවිය**
*B.Com(Sp.) FCA, CIPPCA*

SLAASMB හි අධ්‍යක්ෂ ජනරාල් වන ගීගනගේ මෙනෙවිය, විගණනය, මූල්‍ය හා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව පිළිවෙලින් වරලත් ගණකාධිකාරී ආයතනයක සහ රාජ්‍ය ආයතනයන්හි වසර 35 කට අධික කාලයක පලපුරුද්දක් ලබා ඇත. ඇය ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීන්ගේ සංගමයේ පාලක සභාවේ සහ ප්‍රධාන පෙලේ රාජ්‍ය ව්‍යාපාර ආයතනයක පරිපාලිත සමාගම් හා ආයෝජිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස සේවය කර ඇත. ඇය ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ යාවජීව සාමාජිකාවක් ද වේ.

## කාර්ය මණ්ඩලය






1 ආශා අහමත් මිය
2 අනූෂා අයි මොහොට්ටි මිය
3 වසන්තා ජේ කේ ගීගනගේ මෙනවිය
4 ගයනි එල් පෙරේරා මිය
5 පී එස් බී ඒකනායක
6 එම් සුරනි ටී ප්‍රනාන්දු මෙනෙවිය
7 ඉමල්කා ඉද්දමල්ගොඩ මිය
8 ඉෂාරි එම් සිල්වා මෙනෙවිය
9 මොනිටා එන් බණ්ඩාර මිය
10 එම් ලක්මාලි හේවගේ මෙනෙවිය
11 හෆ්සා බී රසාක් මෙනෙවිය
12 දිලිනිකා මින්මෙන්දආරච්චි මිය
13 රන්දිමා ද සිල්වා මිය
14 එල් වත්සලා මල්ලවාරච්චි මිය
15 කේ රසික එස් බණ්ඩාර
16 එෆ් ශිරෝමි අබේකෝන් මිය
17 ආර් ඒ නදීශානි මනෝදිකා මෙනෙවිය
18 එච් එස් යු පී ජයවර්ධන
19 ඩී එම් නිලන්ති දන්දෙනි මිය
20 ඩබ්ලිව් ජී එරංගා අමාරසී මෙනෙවිය
21 කලණි හෙට්ටිආරච්චි මිය



## තාක්ෂණික කාර්ය මණ්ඩලය

**වසන්තා ගීගනගේ මෙනෙවිය**
*FCA, B.Com (Sp.), CIPPCA*
අධ්‍යක්ෂ ජනරාල්

**අනූෂා අයි මොහොට්ටි මිය**
*FCA, FCMA (UK), FCMA, CGMA, CPA (Aus.), BBA (Hons,)*
*MBA (Leicester)*
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

**ගයනි එල් පෙරේරා මිය**
*FCA, MBA (Finance)*
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
මණ්ඩලයේ ලේකම්

**ආශා අහමත් මිය**
*FCA*
තාක්ෂණික කළමනාකරු

**මොනිටා එන් බණ්ඩාර මිය**
*FCA, (SL), ACA (E&W), BB Mgt (Acc) Sp*
තාක්ෂණික කළමනාකරු

**හෆ්සා බී රසාක් මෙනෙවිය**
*ACA, ACMA*
තාක්ෂණික කළමනාකරු

**ඩබ්ලිව් ජී එරංගා අමාරසී මෙනෙවිය**
*FCA, B.Sc. (Acc) Sp. (Hons.), MBS*
තාක්ෂණික කළමනාකරු

**එම් ලක්මාලි හේවගේ මෙනෙවිය**
*ACA, ACMA*
තාක්ෂණික කළමනාකරු

**ඉමල්කා ඉද්දමල්ගොඩ මිය**
*ACA, B.Sc.(Fin.)Sp.*
තාක්ෂණික කළමනාකරු

**දිලිනිකා මින්මෙන්දආරච්චි මිය**
*ACA, B.Sc.(Acc.)Sp.(Hons.)*
සහකාර තාක්ෂණික කළමනාකරු

**කලණි හෙට්ටිආරච්චි මිය**
*ACA, B.Sc.(Acc.)Sp.(Hons.)*
සහකාර තාක්ෂණික කළමනාකරු

**රන්දිමා ද සිල්වා මිය**
*ACA, B.Sc.(Acc.)Sp.(Hons.)*
සහකාර තාක්ෂණික කළමනාකරු

**ඉෂාරි එම් සිල්වා මෙනෙවිය**
*ACA, B.B.A.(Acc.)Sp.(Hons.)*
සහකාර තාක්ෂණික කළමනාකරු

**ඩී එම් නිලන්ති දන්දෙනි මිය**
*ACA, B.B.A.(Acc.)Sp.(Hons.)*
සහකාර තාක්ෂණික කළමනාකරු

**එල් වත්සලා මල්ලවාරච්චි මිය**
*ACA, B.Sc.(Acc.)Sp.(Hons.)*
සහකාර තාක්ෂණික කළමනාකරු

ක්‍රියාකාරකම් සමාලෝචනය 2016

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ 1997 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. පනතේ සඳහන් නිර්වචන සහ නිර්නායක මත පදනම්ව ඇතැම් ආයතන නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් (නිර්වචනය සඳහා 57 පිටුව බලන්න.) වශයෙන් හඳුනාගෙන ඇත. මෙම නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතු වන අතර නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන්වල විගණකවරුන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කර ඇති වග අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් විසින් තම විගණිත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බව පනතින් නියම වී ඇත. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය එයට ලැබුණු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන්වල විගණන කටයුතු සමාලෝචනය කිරීම, ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සහ, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් සහ ඒවායේ විගණකවරුන් විසින් ප්‍රමිතිවලට අනුකූලව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් උචිත නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම මඟින් සිය කාර්යය ඉටු කරයි. පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති පැනවීම හෝ සම්මත කිරීම සිදු කරනු ලබයි. නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස සහ එවැනි ප්‍රමිති සම්මත කිරීමට ආයතනයට සහය වනු පිණිස පනත යටතේ ගිණුම්කරණ ප්‍රමිති කමිටුවක් සහ විගණන ප්‍රමිති කමිටුවක් ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මත පදනම්ව ගිණුම්කරණ ප්‍රමිති සම්මත කරයි. එමෙන්ම සම්මත කරන ලද විගණන ප්‍රමිති ජාත්‍යන්තර විගණන සහ තහවුරු ප්‍රමිති මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තර විගණන ප්‍රමිති මත පදනම් වේ. වර්තමානයේදී නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් සහ විගණවරුන් විසින් අනුකූල විය යුතු විගණන ප්‍රමිති 36 ක් සහ ගිණුම්කරණ ප්‍රමිති 42 ක් ආයතනය විසින් හඳුන්වා දී ඇත. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් වර්ෂය තුළ සිය ව්‍යවස්ථාපිත කාර්යභාරයන් ඉටුකිරීම සඳහා සිදුකරන ලද ප්‍රධාන මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහතින් දැක්වේ.

## 2. රජයේ විශේෂ ආධාර

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයට එහි කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම පිණිස 2016 ජාතික අයවැය යෝජනා අංක 289 යටතේ රුපියල් මිලියන 100ක අයවැය ප්‍රතිපාදන ලබාදුනි. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයට එහි තාක්ෂණික සහ මූල්‍ය ධාරිතාවය වැඩි කිරීම, එහි කටයුතුවල විෂය පථය පුළුල් කිරීම සහ සැලසුම් පුළුල් කිරීම් සඳහා පහසුකරනු වස් එහි ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා එම අරමුදල් ගරු මුදල් අමාත්‍යතුමා විසින් වෙන් කරන ලදී. එකී සම්පත් උපයෝගී කර ගනිමින් සංකීර්ණ ගිණුම් ගැටළු, තේමාගත සහ ආයතනික සමාලෝචන ඇතුළු නව විගණන ප්‍රවේශයන් පිළිබඳව, විගණකවරුන් සඳහා විස්තරාත්මක වාර්තාකරණය පිළිබඳව, නව විගණන වාර්තා පිළිබඳව සහ ආචාරධර්ම සහ ප්‍රාථමික වෙළෙඳ මෙහෙයුම් පිළිබඳව ජාත්‍යන්තර මෙන්ම දේශීය මානව සම්පත් යොදාගනිමින් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පුහුණු කරනු ලැබීය. තවද සන්නිවේදනය, උත්ප්‍රේරණය සහ සංඛ්‍යාක ව්‍යාපාර වාර්තාකරණයට අදාළ ජාත්‍යන්තර ප්‍රමිති පිළිබඳව පුහුණු ලබා දෙමින් කාර්ය මණ්ඩලයේ හැකියාව වර්ධනය කරන ලදී.

පසුගිය වසර 20 ක කාලයක් පුරා සංශෝධනයට ලක් නොවුණ පනත සංශෝධනය කිරීම හා සම්බන්ධ යෝජනා සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී. විගණන ආයතන අධීක්ෂණය කිරීමට අදාළ සහ රාජ්‍ය අංශයේ මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය කිරීමට අදාළ ව්‍යවස්ථා සංශෝධනද එකී සංශෝධන තුළ අන්තර්ගත විය. තවද යෝජිත රාජ්‍ය අංශයේ මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය සඳහා පූර්ව සුදානම් කටයුතු වශයෙන් කාර්යාල පරිශ්‍රය පුළුල් කිරීමට අදාළ වැඩකටයුතු සමාලෝචිත වර්ෂය තුළදී සිදුකරන ලදී.



## 3. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය

### 3.1 සමාලෝචනය සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය

නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කරනවාද යන්න තහවුරු කරගනු පිණිස මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සිදු කරනු ලැබේ. අනුකූල නොවීමේ ප්‍රමාණාත්මකභාවය මත අනුකූල නොවීම සම්බන්ධයෙන් ගත යුතු පියවර තීරණය කරනු ලැබේ. හඳුනාගැනීම් සහ මිනුම්කරණය සම්බන්ධ අනුකූල නොවීම් පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය ප්‍රධාන වශයෙන් සිය අවධානය යොමු කරයි. ප්‍රමිතිවලට අදාළව අනුකූල නොවීම් සම්බන්ධයෙන් වන වැදගත් කාරණයක් නිරීක්ෂණය නොවන අවස්ථාවකදී එබඳු මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල මූල්‍ය වාර්තා ලෙස සැලකේ. හඳුනාගනු ලැබූ අනුකූල නොවීම් ප්‍රමාණාත්මක වුවත් ව්‍යවස්ථාපිත විධිවිධාන භාවිතා කිරීමට තරම් වැදගත් නොවන අවස්ථාවන්හිදී එවැනි මූල්‍ය ප්‍රකාශන නිරීක්ෂණ සහිතව අනුකූල වූ ලෙස සලකනු ලබන අතර ඒ පිළිබඳ නිරීක්ෂණ අදාළ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය වෙත උපකාරක ලිපියක ස්වරූපයෙන් දැනුම් දෙනු ලැබේ. ප්‍රමිතිවලින් බැහැර වීම ප්‍රමාණාත්මක ලෙස මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය වෙනස්වීමට හේතු වෙයි නම් එබඳු නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායවලින් අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකරනු ලබන බවට එකඟත්වයක් ලබාගනු ලැබේ. නමුත් එවැනි බැහැරවීමක් මගින් මූල්‍ය ප්‍රකාශන තුළ සාවද්‍ය නිරූපනයක් සිදුවේ නම් ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කෙරේ.

### 3.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනයේ වැදගත් අවස්ථා

2016 දෙසැම්බර් 31 දින වන විට පනත යටතේ අධීක්ෂණය කළ යුතු නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 1485 ක් හඳුනාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ දී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය 1,412 කින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 1,536 ලැබුන අතර සමාලෝචිත වර්ෂයේදී සමාලෝචනය කිරීමට සැලසුම් කළ මූල්‍ය ප්‍රකාශන කට්ටල 720 හා සංසන්ධනය කිරීමේදී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 678 කට අදාළව මූල්‍ය ප්‍රකාශන කට්ටල 731 ක සමාලෝචන නිම කරන ලදී. වඩා ශක්තිමත් ආකාරයෙන් සමාලෝචන සිදුකිරීම පිණිස තාක්ෂණික ධාරිතාවය වැඩිදියුණු කිරීමේ අභිප්‍රාය ඇතිව 2016 වර්ෂයේදී කාර්ය මණ්ඩලය ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති නියාමනය කිරීම සම්බන්ධයෙන් අංග සම්පූර්ණ පුහුණුවක් ලැබුහ. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය පූර්ව වර්ෂයේදී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 1,068 කට අදාළව මූල්‍ය ප්‍රකාශන කට්ටල 1,122 ක් සමාලෝචනය කර ඇත.

### 3.3 මණ්ඩලයේ කාර්යසාධන සංඛ්‍යාලේඛන

| | අයිතමය | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| 1 | **හඳුනාගන්නා ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව (කාලපරිච්ඡේදය අවසානයට)** | 1,358 | 1,353 | 1,140 | 1,485 |
| 2 | **ලැබුණු මූල්‍ය ප්‍රකාශන** | | | | |
| | මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 1,322 | 1,371 | 1,430 | 1,536 |
| | නි.ව්‍යා.ව්‍යවසාය සංඛ්‍යාව | 1,248 | 1,289 | 1,345 | 1,412 |
| 3 | **මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය** | | | | |
| | සමාලෝචන සංඛ්‍යාව | 751 | 1,200 | 1,122 | 731 |
| | නි.ව්‍යා.ව්‍යවසාය සංඛ්‍යාව | 708 | 1,151 | 1,068 | 678 |
| 4 | **නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග** | | | | |
| | **අනුකූලවීම්** | | | | |
| | මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 309 | 498 | 553 | 436 |
| | නි.ව්‍යා.ව්‍යවසාය සංඛ්‍යාව | 280 | 483 | 534 | 417 |
| | **නිරීක්ෂණ සහිතව අනුකූල වීම්** | | | | |
| | මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 438 | 697 | 567 | 291 |
| | නි.ව්‍යා.ව්‍යවසාය සංඛ්‍යාව | 424 | 674 | 541 | 262 |
| | **අනුකූල නොවීම්** | | | | |
| | (එකඟතාවයන් ලබාගැනීම හා නියමයන් පැනවීම්) | | | | |
| | මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 4 | 5 | 2 | 4 |
| | නි.ව්‍යා.ව්‍යවසාය සංඛ්‍යාව | 4 | 5 | 2 | 4 |
| 5 | **නි.ව්‍යා.ව්‍යවසාය ප්‍රතිශතය අනුව නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග** | | | | |
| | අනුකූල වීම් | 39% | 42% | 50% | 61% |
| | නිරීක්ෂණ සහිත අනුකූල වීම් | 60% | 58% | 50% | 38% |
| | අනුකූල නොවීම් | | | | 1% |
| | (එකඟතාවයන් ලබාගැනීම හා නියමයන් පැනවීම්) | 1% | | | |

3.4 2016 වර්ෂයේදී ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අනුව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 61% ක් අනුකූලවද තවත් 38% ක ප්‍රමාණයක් නිරීක්ෂණ සහිතව අනුකූලවද පැවැති බව අනාවරණය විය. 2012 ජනවාරි 1 වැනිදා සිට නව ගිණුම්කරණ ප්‍රමිති ක්‍රියාත්මක කිරීම හේතුකොටගෙන නිරීක්ෂණ සහිතව අනුකූල වී තිබුණු නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් සංඛ්‍යාව පසුගිය වර්ෂවලදී ඉහළ අගයක් ගෙන තිබුණි.

3.5 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති යටතේ ඇති අවශ්‍යතා සැලකිය යුතු ලෙස අනුගමනය කර නොතිබීම හේතුවෙන් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් හතරක මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය සැලකිය යුතු ලෙස වෙනස් වී ඇති බව අනාවරණය විය. එම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගෙන් ලබා ගන්නා ලද එකඟතාවයන් රුපියල් බිලියන 1.91ක ශුද්ධ ලාභය/ හිමිකම නිවැරදි කිරීමට හේතු විය. (මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සම්බන්ධ නිරීක්ෂණ සඳහා 19 වන පිටුව බලන්න. 2016 වර්ෂයේදී ලබාගත් එකඟතාවයන් සඳහා 21 වන පිටුව බලන්න.) මෙම එකඟතාවයන්ට අනුකූල වීම සම්බන්ධයෙන් පසුකාලීන වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල පසු විපරම් කටයුතු සිදු කරනු ලැබේ.

3.6 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් ප්‍රමාණවත් නමුත් ව්‍යවස්ථාපිත විධිවිධාන භාවිතා කිරීමට තරම් වැදගත් නොවන අවස්ථා හඳුනාගත් විට එබඳු අනුකූල නොවීම් උපකාරක ලිපි ස්වරූපයෙන් දැනුම් දෙනු ලැබේ. නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන්වලට තම මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය වැඩි දියුණු කරගැනීම සඳහා දිරිගන්වනු පිණිස උපකාර ලිපි 294 ක් නිකුත් කරන ලදී.

## 4 විගණන පරීක්ෂණ

සමාලෝචිත වර්ෂයෙදී වෘත්තියේ නියැලි වරලත් ගණකාධිකාරී ආයතන 14 ක් මගින් සිදුකරන ලද විගණන 99 ක් පරීක්ෂා කරන ලද අතර පූර්ව වර්ෂයේදී ආයතන 29ක් මගින් සිදුකරන ලද විගණන 91 ක් පරීක්ෂා කරන ලදී. සමාලෝචිත වර්ෂයේ දී පරීක්ෂා කරන ලද විගණන ලිපිගොනු අවධානම් පාදක ප්‍රවේශය මත තෝරාගන්නා ලදී. අවධානම් පාදක විගණනයන් බොහෝමයක් ආයතන සුළු ප්‍රමාණයක් අතර කේන්ද්‍රගත වීම හේතුකොටගෙන 2016 වර්ෂයේදී පරීක්ෂා කරන ලද විගණන ආයතන සංඛ්‍යාව 2015 වර්ෂයට සාපේක්ෂව පහත බැස තිබුණි.

ජාත්‍යන්තර උපදේශකයෙකු විසින් පවත්වන ලද පරිපූර්ණ පුහුණු සැසිවල ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂයේ තෙවන කාර්තුවේ අවසානය වන විට විගණන පරීක්ෂණ ප්‍රවේශය පුළුල් කරන ලදී. ප්‍රතිශෝධිත ක්‍රමවේදයේදී විගණනය හා සම්බන්ධ ප්‍රමාණාත්මක අවදානම් හඳුනාගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලබන අතර පරීක්ෂා කිරීමට පෙරාතුව අවදානම් හඳුනාගෙන ඇති විටදී ඒ පිළිබඳ ගැඹුරින් පරීක්ෂා කිරීම සිදුකෙරේ. 2016 වර්ෂයේ ජාතික අයවැය වෙන්කිරීම් මගින් උක්ත ධාරිතා සංවර්ධන ක්‍රියාවලිය හරහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය ශක්තිමත් කිරීමට සහ වැඩිදියුණු කිරීමට අවස්ථාව සලසා දෙන ලදී. විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වුන සැලකිය යුතු ලෙස වූ අනුකූල නොවීම් හේතුකොටගෙන මූල්‍ය ප්‍රකාශන නැවත විගණන කරගන්නා ලෙස නියම කරමින් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් දෙකකට නියෝග නිකුත් කරන ලදී. වර්ෂයේ සිදුකරන ලද පරීක්ෂා කිරීම් මගින් 2015 වර්ෂයේදී ආයතන 29 ක් විසින් පවත්වන ලද විගණන 56 කට සාපේක්ෂව මෙම වර්ෂයේ දී ආයතන 12 ක් විසින් සිදුකරන ලද විගණන 55 කට අදාළව අඩුපාඩු නිරීක්ෂණය විය. ඒ සම්බන්ධයෙන් අදාළ විගණන ආයතන වෙත ප්‍රබල ලෙස අවධාරණය කරන ලදී. (විගණන නිරීක්ෂණ සම්බන්ධ තොරතුරු සඳහා 33 වන පිටුව බලන්න)

තවද උක්ත ධාරිතා වර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය එහි අවධානය තේමාගත පරීක්ෂණ සහ ආයතනික ගුණාත්මක පරීක්ෂණ කෙරෙහි යොමු කරමින් 2017 වර්ෂයේදී විගණන පරීක්ෂණවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට සැලසුම් කොට ඇත.

## 5 විමර්ශන

ටච්වුඩ් ඉන්වෙන්ස්ට්මන්ට් සමාගමේ ජෛව වත්කම් සම්බන්ධයෙන් එහි 2005 සහ 2006 මාර්තු 31 න් අවසන් වන වර්ෂ සඳහා පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති තක්සේරු වටිනාකම් පිළිබඳව පැහැදිලි ලෙසම විශ්වාසනීය නොවූ හෙයින් අදාළ කරුණ නීතිපතිවරයා වෙත යොමුකරන ලෙසට මණ්ඩලය විසින් ගෙන තිබූ තීරණය නිෂ්ප්‍රභා කරන ලෙස 2007 වර්ෂයේ දී ටච්වුඩ් ඉන්වෙන්ස්ට්මන්ට් සමාගම අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරන ලදී. අභියාචනාධිකරණය විසින් 2010 වර්ෂයේදී එම ඉල්ලීමට අවසර ලබාදුන් බැවින් එම තීන්දුවට එරෙහිව ඇපෑලක් ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මණ්ඩලයට විශේෂ අවසරයක් ලබා දෙන ලදී.

ණය හිමියෙකු විසින් තමාට නියමිත ණයමුදල් ගෙවීම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් ගොනුකරන ලද ඈවර කිරීමේ පෙත්සමක් පදනම් කරගෙන කොළඹ ඉහළ වානිජ අධිකරණය විසින් ටච්වුඩ් ඉන්වෙන්ස්ට්මන්ට් සමාගම සඳහා ඈවරකරුවෙකු 2014 වර්ෂයෙදී පත්කරන ලදී. දැනට එහි ඈවර කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී. අභියාචනාධිකරණය දුන් තීන්දුවට එරෙහිව ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් ගොනුකරන ලද අභියාචනයට තමා එකඟතාවය දක්වන බව ඈවරකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට දැන්වූ බැවින් අභියාචනාධිකරණයේ තීන්දුව ඉවතා දමන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය 2016 මාර්තු 29 වැනි දින නියෝග කරන ලදී.

## 6 පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේ නිර්දේශයන්ගේ කාර්යසාධනය

පසුගිය වසර දෙකක කාලය තුළ සියලුම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවට (කෝප් කමිටුවට) දුන් එකඟතාවයට අනුව කටයුතු කිරීමෙන් අනතුරුව අනුකූල නොවීම් පිළිබඳ අනාවරණය කිරීම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් වඩා හොඳ ක්‍රමවේදයක් වශයෙන් අනාගතයේදී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සඳහා අවධානම් පාදක තෝරාගැනීම් කෙරෙහි යොමුවීම පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය සැලකිල්ල යොමු කර ඇත. නියාමනයට ලක්වන සියලුම ආයතන වාර්ෂිකව ආවරණය වන පරිදි සියලුම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් වර්ෂ 3 සිට 5 දක්වා වූ කාලපරිච්ඡේදයක් තුළ සමාලෝචනය කිරීම කෙරෙහි ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය අවධානය යොමුකරන අතර එහිදී ඉහළ අවධානමක් සහිත පෞද්ගලික ආයතන සෑම වසර 3 කට වරක් හා අඩු අවදානම් සහිත පෞද්ගලික ආයතන වසර 5 කට වරක් සමාලෝචනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. ලෝක බැංකුව විසින් තම Report on the observance of Standards and Cords, Accounting and Auditing 2015 (ROSC) යන වාර්තාව මගින් සහ ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයින් විසින් ඉහළ අවදානම් සහිත ආයතන සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳ සවිස්තරාත්මකව උපදෙස් ලබා දී ඇත. තවද මෙම වර්ෂයේ ධාරිතා වර්ධන කටයුතුවල නියැලී සිටි අන්තර්ජාතික උපදේශකවරුන් විසින්ද මෙම ක්‍රමවේදය ගෝලීය වශයෙන් භාවිතා කරන ක්‍රමවේදය වශයෙන් හඳුනා ගෙන ඇත.

නියාමනය පිළිබඳ කරුණුද ඇතුළත්ව ජාත්‍යන්තර උපදේශකයෙකු විසින් කාර්යමණ්ඩලයට පුහුණුව ලබාදුන් නව විගණන පරීක්ෂණ ප්‍රවේශය මත පදනම්ව 2017 වර්ෂයේ සිට සිදුකිරීමට නියමිත විගණන පරීක්ෂණ අවදානම් හඳුනා ගැනීමේ ප්‍රවේශයන් හරහා වඩා ගැඹුරින් සිදුකරනු ලබන පරීක්ෂණයන් වනු ඇත. අවධානය යොමු කිරීමේ ස්වභාවය හේතුකොටගෙන විගණන පරීක්ෂණ සැලැස්ම සහ වාර්තාකරණය වඩාත් සවිස්තරාත්මක වනු ඇත. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය තේමාගත පරීක්ෂණ මෙන්ම ආයතනික ගුණාත්මක පරීක්ෂණ 2017 වර්ෂයේදී සිදුකිරීමට සැලසුම් කර ඇත.

## 7 ප්‍රමිති පැනවීමට දැක්වූ සහයෝගය

7.1 මුදල් අමාත්‍යාංශය සමග එළඹි වර්තමාන ගිවිසුම ප්‍රකාරව ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ හා විගණන ප්‍රමිති කමිටුවේ කටයුතු පහසු කරනුවස් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට රුපියල් මිලියන 2.5 ක වාර්ෂික ප්‍රදානයක් කිරීම තවදුරටත් සිදුකළ අතර එමගින් උසස් ගුණාත්මක ප්‍රමිති පැනවීම හේතුවෙන් මණ්ඩලයේ කටයුතු නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුවක් සැලසෙයි.

7.2 ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සංශෝධනය කිරීමට අදාළව වර්ෂය තුළදී සිදුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහතින් දැක්වේ.

(අ) දැනට පවත්නා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, කලින් භාවිතා කළහැකි වැඩිදියුණු කිරීම් හැර 2016 ට අදාළ වැඩිදියුණු කිරීම් ඇතුලත් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (2016) සමග සංසන්ධනය කරන ලද ප්‍රකාශනය ආයතන පාලක සභාව (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය) විසින් 2016 වර්ෂයේදී අනුමත කරන ලද අතර එය ගැසට් කිරීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

(ආ) එක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියක් සහ දැනට පවත්නා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හයකට සිදුකරන ලද සංශෝධන ගැසට් පත්‍රයේ පළකිරීමට අදාළ කටයුතු සිදුවෙමින් පවතී. මේවා අතරින් ප්‍රමිති



ක්‍රියාකාරකම් සමාලෝචනය 2016

තුනකට සිදුකරන ලද සංශෝධන 2017 ජනවාරි 01 දින සිට බලපැවැත්වේ.

(ඇ) විවිධ උනන්දුකාර පාර්ශ්ව අතර ගිණුම්කරණ ප්‍රමිති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් වශයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතන විසින් පුළුල් සම්මන්ත්‍රණ සහ වැඩසටහන් මාලාවක් පවත්වා ඇත.

(ඈ) ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිති කමිටුව International Quality Control, Auditing, Review, Other Assurance and Related Service Pronocucements නමින් ජාත්‍යන්තර ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනය විසින් පළකරන ලද අත්පොත අධ්‍යයනය කරමින් පසුවන අතර මෙම නව සහ සංශෝධිත ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 2018 මාර්තු 31 දිනෙන් හෝ ඊට පසුව අවසන්වන කාලපරිච්ඡේද සඳහා වන මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සඳහා බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පාලක සභාව අනුමත කර ඇත.

(ඊ) ප්‍රමිති භාවිතාකරන සාමාජිකයින්, මූල්‍ය විධායක නිලධාරීන් සහ විගණන කමිටු සාමාජිකයින් සඳහා නව සහ සංශෝධිත විගණන ප්‍රමිති සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතන විසින් පවත්වා ඇත.

## 8 ජාත්‍යන්තර සබඳතා

**8.1** ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය ජාත්‍යන්තර සංවිධාන තුළ පවත්වාගෙන යන සාමාජිකත්වය හේතුකොටගෙන මූල්‍ය වාර්තාකරණය, විගණනය සහ ප්‍රමිතිවලට අනුකූලවීම් සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම ආදියට අදාළ කරුණු පිළිබඳ ලෝකය පුරා සිදුවන නව වර්ධනයන් සමඟ එකට ගමන් කිරීමට හැකි වී ඇත. එමෙන්ම අනෙකුත් නියාමනයන්ගෙන් තොරතුරු සහ සහාය ලබාගැනීමට සහ ඒකාබද්ධ ක්‍රියාකාරකම් වශයෙන් බොහෝ නියාමකයින් සඳහා ප්‍රයෝජනවත් වන ක්‍රියාකාරකම්වල නිරතවීම සඳහාද එමගින් අවකාශ සැලසී ඇත. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය මෙම වර්ෂය තුළ දී පහත සඳහන් ජාත්‍යන්තර සංවිධාන සමග සිය සාමාජිකත්වය තවදුරටත් පවත්වා ගෙන යන ලදී.

(අ) ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) 2007 වර්ෂයේදී පැවැත්වූ පළමු රැස්වීමේ සිට ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය එහි සාමාජිකත්වය දරයි.

(ආ) ජාත්‍යන්තර විගණන හා තහවුරු ප්‍රමිති මණ්ඩලයේ (IAASB) උපදේශාත්මක නිර්දේශ කණ්ඩායම 2007 වර්ෂයේදී ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය එහි සාමාජිකයෙකු වශයෙන් පත්කරන ලදී.

(ඇ) ගණකාධිකාරීවරුන් සඳහා වන ජාත්‍යන්තර ආචාරධර්ම ප්‍රමිති මණ්ඩලයේ (IESBA) උපදේශාත්මක නිර්දේශ කණ්ඩායම 2009 වර්ෂයේදී ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය එහි සාමාජිකයෙකු වශයෙන් පත් කර ඇත.

**8.2** ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ කාර්යමණ්ඩලය ජාත්‍යන්තර ගිණුම්කරන සහ වාර්තාකරණ ප්‍රමිති (ISAR) පිළිබඳ අන්තර්රාජ්‍ය ප්‍රවීණයන්ගෙන් කණ්ඩායම් සැසියේදී ශ්‍රී ලංකාව නියෝජනය කළේය. මෙහි ලේකම් කාර්යාලයේ ආරාධනය මත ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩල නියෝජිතයා විසින් IFRS-16- කල් බදු ප්‍රමිතිය සම්බන්ධයෙන් තාක්ෂණික වැඩමුළුවේ දී දේශනයක් ඉදිරිපත් කරන ලදී.

**8.3** ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදයේ වැඩමුළුවක් 2018 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පැවැත්වීමට අනුග්‍රහය දක්වමින් එයට ඒ සඳහා ආරාධනා කරන ලදී. ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදය මෙවැනි වැඩමුළු වාර්ෂිකව පවත්වනු ලබන අතර ආසන්න වශයෙන් රටවල් 50කින් පමණ නියාමන සාමාජිකයන් එයට සහභාගී වේ.

**8.4** ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති හා විගණන ප්‍රමිති මූලධර්ම පිළිබඳ දැනුම, නවීනතම ප්‍රමිති පිළිබඳ දැනුවත් වීම, ප්‍රමිතිවල නවීන සහ අනාගත සංවර්ධනයන්ගේ දිශානතියන පිළිබඳ දැනුම යාවත්කාලීන කර ගැනීම පහසුකරන ජාත්‍යන්තර සැසිවලට ද කාර්යමණ්ඩලය සහභාගී වූහ. මෙම සැසි, සිද්ධි සහ නිර්වචනයන් මගින් සහ දැනුම හුවමාරුකර ගැනීමේ අවස්ථා සඳහා ජාත්‍යන්තර සබඳතා ස්ථාපිත කිරීම මගින් එම මූලධර්ම යොදා ගැනීම පිළිබඳව ප්‍රායෝගික මඟපෙන්වීම් සිදුකරන ලදී. ධාරිතා වර්ධනය සඳහා 2016 වර්ෂයේ දී



SLAASMB
ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය



ලබාදුන් විශේෂ රාජ්‍යය අනුග්‍රහය නිසා සියලුම තාක්ෂණික කාර්යමණ්ඩලයට මෙම ක්ෂේත්‍ර පිළිබඳ ජාත්‍යන්තර මට්ටමේ දැනුමක් ලබාදීමට හැකිවිය.

## 9 මානව සම්පත්

### 9.1 කාර්යමණ්ඩලය

2016 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ කාර්යමණ්ඩලය 21 දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඉන් 15 දෙනෙක් වරලත් ගණකාධිකාරීවරු වූහ. සමස්ත තාක්ෂණ කාර්යමණ්ඩලය අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරු දෙදෙනෙක්, තාක්ෂණික කළමණාකරුවන් 6 දෙනෙක් සහ සහකාර තාක්ෂණික කළමනාකරුවන් 6 දෙනෙකුගෙන් සමන්විත විය.

තාක්ෂණික කාර්යමණ්ඩලයෙන් 6 දෙනෙක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ නිරත වූ අතර 9 දෙනෙක් ස්ථිර පදනම මත සේවයේ නිරත වූහ. වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ මත අමාත්‍යාංශයෙන් ලද අනුමැතිය යටතේ ක්‍රියාත්මක කළ දිරිදීමනා ගෙවීමේ ක්‍රියාවලිය කාර්යමණ්ඩලයේ විභවතාව ඉහළ නැංවීම සඳහා ඉවහල් විය. වර්ෂය තුළ අවස්ථා 19 කදී මූල්‍ය වාර්තාකරණය, විගණනය සහ නියාමනය යන ක්ෂේත්‍රවලට අදාළව සමුළු, වැඩමුළු හා පුහුණු වැඩසටහන්වලට සහභාගී වෙමින් කාර්යමණ්ඩලය එකී ක්ෂේත්‍රයන්හි ජාත්‍යන්තර තත්ත්වයන් පිළිබඳ අවබෝධයක් ලබාගත්හ. මෙයින් සැසි 12 ක් වෙනුවෙන් කාර්යමණ්ඩලයේ ධාරිතා වර්ධනය අරඹයා රජයෙන් ලද විශේෂ අරමුදල් මගින් යොදාගන්නා ලදී.

### 9.2 බාහිර සමාලෝචන මණ්ඩලය

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කරන ලද නිර්දේශවලට අනුකූලවනු වස් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් සමාලෝචනයට භාජනය කරනු ලබන මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් දරනු ලබන ප්‍රයත්නයේදී මූල්‍ය වාර්තා සමාලෝචනය කිරීම සඳහා බාහිර සමාලෝචකයින් යොදා ගැනීම අඛණ්ඩව සිදුකෙරුණි. 2011 වර්ෂයේදී එසේ බාහිර සමාලෝචක මණ්ඩලය වශයෙන් යොදාගත් සමාලෝචකයින් සංඛ්‍යාව 2016 වර්ෂය ආරම්භයේදී 03 දක්වා පහත බැස තිබුණ අතර එය වර්ෂයේ දෙවන අර්ධ භාගයේදී 21 දක්වා වර්ධනය කරන ලදී. මණ්ඩලයේ තාක්ෂණ කාර්යමණ්ඩලය විසින් අලුතින් සේවයට එක්වුණ සමාලෝචකයින් උදෙසා සමාලෝචන යාන්ත්‍රණය පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණ කරන ලද මූල්‍ය වාර්තා සමාලෝචන ප්‍රමාණයෙන් මූල්‍ය වාර්තා කට්ටල 113ක මූලික සමාලෝචනය සමාලෝචකයින් විසින් සම්පූර්ණ කොට ඇත. බාහිර සමාලෝචකයින් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 1.9 ක මුදලක් ගෙවනු ලැබීය. අමතර තොරතුරු ලබාගැනීම, නිවැරදි කිරීම සඳහා එකඟතාවයන්ට එළඹීම සහ නිරීක්ෂණ ලිපි නිකුත් කිරීම ඇතුළුව සමාලෝචන කටයුතු අවසාන වශයෙන් සම්පූර්ණ කිරීම ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ තාක්ෂණ කාර්ය මණ්ඩලය විසින් සිදුකරනු ලැබේ.

## 10 පාලනය

**10.1** පනතේ විධිවිධාන ප්‍රකාරව නිලබලයෙන් පත්කරන ලද සාමාජිකයන් 3 දෙනෙකුගෙන් සහ හඳුනාගන්නා ලද ආයතනවලින් ලද නාමයෝජනා අතරින් මුදල් අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් 10 දෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත වේ. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා අධ්‍යක්ෂ ජනරාල්වරයා නිලබලයෙන් පත්වූ සාමාජිකයන් තිදෙනා වේ. පත්කළ සාමාජිකයන් වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (3 දෙනෙක්), එක්සත් රාජධානියේ වරලත් කළමනාකාර ගණකාධිකාරීන්ගේ ආයතනයේ ශ්‍රී ලංකා අංශය, ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ලංකා වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා කර්මාන්ත සහ වානිජ මණ්ඩල සම්මේලනය, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම්කරනු ලබන තැනැත්තන්ය. සාමාජිකයෙකුගේ නිලකාලය වර්ෂ හතරකි.

**10.2** ශ්‍රී ලංකා මහ බැංකුවේ නීති සහ අනුකූලතා අධ්‍යක්ෂවරයා වන පී.වී.එල්.නන්දසිරි මහතා වර්ෂය තුළ දී සභාපතිවරයා වශයෙන් කටයුතු කළේය. ශ්‍රී ලංකා කර්මාන්ත හා වානිජ මණ්ඩල සම්මේලනයෙන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නාමයෝජනා නොලැබීම නිසා මණ්ඩලයේ තනතුරු 2 ක් වර්ෂය අවසානය දක්වා පුරප්පාඩුව පැවතුණි.

SLAASMB
ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

**10.3** පනත ප්‍රකාරව මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත්කල ඩී.ඩී. වාස් ගුණසේකර, එන්. ජයසිංහ සහ එන්. සිවප්‍රගාසම් යන මහත්ම මහත්මීන් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් වල අධ්‍යක්ෂවරු හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරීවරු වශයෙන් සේවය කළහ. එමෙන්ම මණ්ඩලයේ සාමාජිකයන් වූ ඒ. හේරත්, ජේ. පෙරේරා සහ එල්. වික්‍රමසිංහ යන මහත්වරු ඇතැම් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් විගණනය කරනු ලබන ගණකාධිකාරී ආයතනවල හවුල්කරුවන් වශයෙන් කටයුතු කළහ. මණ්ඩලයේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීම පිණිස නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් හෝ එහි විගණනයට අදාළ සියළු ලිපි ලේඛන අදාළ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් හෝ ඒවායේ විගණකවරු සමඟ සබඳතා ඇති සාමාජිකයින් වෙත ලබා නොදෙන අතර එම නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්ට අදාළ කරුණු ඇතුළත් සාකච්ඡා සඳහා එවැනි සාමාජිකයෝ සහභාගී නොවෙති.

**10.4** අධ්‍යක්ෂ ජනරාල් ගාමිණී විජේසිංහ මහතා විගණකාධිපති වශයෙන් පත්වීම භාරගනු පිණිස 2015 නොවැම්බර් මාසයේදී සිය තනතුරෙන් ඉල්ලා අස්වූ පසු 2016 අප්‍රේල් මස 25 වෙනිදා සිට වසන්තා ගීගනගේ මෙනවිය අධ්‍යක්ෂ ජනරාල් ධූරයේ රාජකාරී ආරම්භ කළාය.

**10.5** වර්ෂය තුළ මණ්ඩලයේ රැස්වීම් වාර 13ක් පවත්වන ලදී. සමස්ථ මෙහෙයුම් දර්ශකයන්ට අනුව කාර්ය මණ්ඩල සාධනය, ඈවර කිරීමේ හෝ නඩු මාර්ග යට අවතීර්ණව පවතින ව්‍යවසායන්හි වැදගත් තාක්ෂණික ගැටළු විසඳීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ 1995 අංක 15 දරන පනතේ ව්‍යවස්ථාපිත විධිවිධානයන් සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම වසර තුළදී මණ්ඩලයේ සාකච්ඡාවට භාජනය විය. නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙත අස්වැසීම් ලිපි යැවීමෙන් සිදුවන අනිටු ප්‍රතිවිපාක, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ප්‍රමිති සම්බන්ධයෙන් අනුකූල නොවීම පිළිබඳ ගැටළු, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික අයවැය ලේඛනය සහ සංස්ථාපිත සැලැස්ම අනුමත කරීම ආදිය පිළිබඳව ද මණ්ඩලය සිය අවධානය යොමුකරන ලදී. තාක්ෂණික ක්‍රියාකාරකම් සඳහා යෝග්‍ය කාර්යමණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීම උදෙසා කාර්යමණ්ඩල, පාරිශ්‍රම ක්‍රමය සංශෝධනය කිරීමට උපයෝගී කරගත හැකි විවිධ ප්‍රවේශයන් සමාලෝචනය කිරීමේ කාර්යයෙහි ද මණ්ඩලය නිරත විය.

**10.6** මණ්ඩලයේ බලය පැවරීමේ ප්‍රතිපත්ති අනුව තොරතුරු රැස්කිරීම, මූල්‍ය ප්‍රකාශන සහ විගණන සමාලෝචනය කිරීම සහ විමර්ෂණ පැවැත්වීම වැනි ප්‍රමිතීන්ට අනුකූල වීම අධීක්ෂණය කිරීමට අදාළ නිරන්තර මෙහෙයුම් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් දෙදෙනෙකු සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධීක්ෂණය සහ මඟපෙන්වීම යටතේ කාර්යමණ්ඩලය විසින් ඉටුකරන ලදී.

## 11 මූල්‍ය කාර්යසාධනය

වර්ෂය තුළ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ මෙහෙයුම් වියදම රුපියල් 94,050,511 ක් වූ අතර ඊට අනුරූපව පූර්ව වර්ෂයේ වියදම රුපියල් 69,158,863 ක් විය. විශේෂ ධාරිතා ප්‍රවර්ධන වැඩසටහන සඳහා වැය කළ රුපියල් 21,679,041 මෙහෙයුම් වියදම සැලකිය යුතු ලෙස වැඩිවීම ඒ සඳහා හේතු විය. වර්ෂය තුළ මෙහෙයුම් වියදමේ වැඩිවීම (ධාරිතා ප්‍රවර්ධන වියදම් හැර) 4.64% ක් විය. වර්ෂය තුළ කාර්යමණ්ඩල පිරිවැය රුපියල් 39,350,133 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාර්යමණ්ඩල පිරිවැය 37,332,152 ක් විය. ඒ අනුව වර්ෂය තුළ කාර්යමණ්ඩල පිරිවැයේ වැඩිවීම 5.4% ක් විය. මණ්ඩලයේ මෙහෙයුම් වියදම්වලින් කාර්යමණ්ඩල පිරිවැය (ධාරිතා ප්‍රවර්ධන වියදම් හැර) 54% ක් ලෙස ගණනය කර ඇත.

රජය විසින් සපයන ලද අරමුදල් මගින් වියදම් පියවා ගැනිණි. මණ්ඩලයේ වියදම් පියවා ගැනීම සඳහා විකල්පයක් ලෙස පනත ප්‍රකාරව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි කොටස් හිමියන්ගේ ස්කන්ධය හෝ බදු ගෙවීමෙන් පසු ලාභය යන ද්විත්වයෙන් වැඩි අගය මත පදනම්ව මුදල් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිශතයක සෙස් බද්දක් අය කළ හැකිය. කෙසේ වුවද, මෙම විකල්පය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය වැඩි කැමැත්තක් නොදැක්වූ අතර 2008 ජනවාරි 01 දින හෝ ඊට පසුව ක්‍රියාත්මක කිරීමට අනුමත කර තිබූ සෙස් බදු යෝජනාව 2008 ඔක්තෝබර් 07 දින ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලා අස්කරගන්නා ලදී.



# ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණය මණ්ඩලය ශක්තිමත් කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා 2016 ජාතික අයවැය මගින් පරිපූරක අයවැය යටතේ වෙන් කරන ලද අරමුදල් උපයෝගී කර ගැනීම

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා 2016 ජාතික අයවැයෙහි යෝජනා අංක 289 යටතේ වෙන් කරන ලද අයවැය ප්‍රතිපාදන මණ්ඩලයට ලැබුණි. නියාමන කාර්යයන් ශක්තිමත් කිරීමේ දී හඳුනා ගන්නා ලද සංශෝධනයන් පනතට ඇතුළත් කිරීම මගින් පනත ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව, පරීක්ෂණ කාර්යයන් පුළුල් කිරීම සඳහා කාර්යමණ්ඩලයේ ධාරිතාවය වර්ධනය කිරීම සහ සැලසුම් කරන ලද පුළුල් කිරීම් සිදු කිරීම සඳහා අවශ්‍ය යටිතලපහසුකම් සැපයීම මෙහිදී වැදගත් කෙෂ්ත්‍ර ලෙස හඳුනාගන්නා ලදී. මෙම අරමුදල් උපයෝගී කරගෙන ඉටු කරන ලද කාර්යයන් පහතින් විස්තර කර දැක්වේ.

## 2. ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

වර්තමානයේ පවත්නා පනතට එය පැනවූ 1995 වර්ෂයේ සිට සංශෝධනයන් සිදු කර නොමැත. කෙසේ වෙතත්, පසුගිය වසර 16ක කාල පරිච්ඡේදය තුළ ක්‍රියාකාරී මෙහෙයුම් සිදු කිරීමේ දී මූල්‍ය ප්‍රකාශන හා විගණන නියාමනය කිරීමට අදාළව පවරන ලද නියාමන බලතල ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණය මණ්ඩලය බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දුනි. එකී ඇතැම් සංකීර්ණතාවලට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා නිශ්චිත වූ කාලවකවානුවක් පනතෙහි සඳහන් නොවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීමේ දී සිදුවන දුෂ්කරතාවන්, තොරතුරු ප්‍රකාශයට පත්කිරීම සඳහා ව්‍යවස්ථාව මගින් නිශ්චිතම අවසර නොදීම හේතුවෙන් අනුකූල නොවීම් පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත්කිරීමට නොහැකිවීම, නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නොවන වැරදි සඳහා දඩමුදල් අයකිරීමේ ක්‍රමවේදයක් නොමැතිවීම සහ සොයාගැනීම් ප්‍රසිද්ධ කිරීම සම්බන්ධයෙන් ඇති බාධක යන කරුණු ඇතුළත් විය. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණය මණ්ඩලය පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය ප්‍රමුඛත්වයෙහිලා කටයුතු කළ අතර සිදුකළ යුතු හඳුනා ගන්නා ලද සංශෝධනයන් මණ්ඩලය විසින් අනුමත කරනු ලදුව වර්ෂය තුළදී මුදල් අමාත්‍යාංශය වෙත යොමුකරන ලදී. තවද සංශෝධනයන් තුළ විගණන ආයතනික ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම රාජ්‍ය අංශයේ මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය කිරීම ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණ හඳුන්වා දෙන ලදී.

## 3. පරිශ්‍රය අළුත්වැඩියා කිරීම/පුළුල් කිරීම

පනතේ යෝජිත සංශෝධනයන් සමග රාජ්‍ය අංශය අධීක්ෂණය කිරීම සඳහා කැපවීමෙන් කටයුතු කරන කාර්යමණ්ඩලයක අවශ්‍යතාවය හඳුනාගන්නා ලද අතර වර්තමානයේ කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ 1 වැනි මහලින් අතිරේක කාර්යාල ඉඩපහසුකම් සලසා ගන්නා ලදී.තවද ආරම්භක කටයුතු වශයෙන් වර්ෂයේ ආරම්භ කරන ලද මූලික සැලසුම් සඳහා ගෘහනිර්මාණ උපදේශයෙකු තෝරාගැනීම සඳහා මූලික කටයුතු සිදු කරන ලදී.

## 4. ධාරිතා වර්ධනය

### 4.1 පොදු සමාලෝචනය

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණය මණ්ඩලයේ කුසලතා කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධාන කාරණයක් වශයෙන් සමීක්ෂණ ක්‍රියාවලියේ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා කාර්යමණ්ඩලයේ සංවර්ධනය, අඛණ්ඩ ඉගෙනුම් ක්‍රියාවලිය සහ වෘත්තීය අභිවෘද්ධිය සහ බාහිර සමාලෝචන මණ්ඩලයේ සංවර්ධනය සහ අඛණ්ඩ ඉගෙනුම් ක්‍රියාවලිය වෙනුවෙන් පුහුණුව ලබා දීම කෙරෙහි අවධානය යොමුවීය. තවද, ගිණුම් සහ විගණන ප්‍රමිතිවලට අනුකූලවීම තර කරනු පිණිස ප්‍රධාන හවුල්කාර කණ්ඩායම් තුනක ධාරිතා වර්ධනය සිදුකිරීම පිළිබඳව ද අවධානය යොමු විය.

### 4.2 කාර්යමණ්ඩලයේ ධාරිතා වර්ධනය

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය බහුවිධ අධ්‍යාපනික වැඩසටහන් මගින් තම කාර්යමණ්ඩලයේ පුහුණු හා සංවර්ධන ක්‍රියාවලිය අඛණ්ඩවම සිදුකරන අතර ඒ වෙනුවෙන් දේශීය හා

# 2016 වර්ෂයේදී සමාලෝචනය කරන ලද ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූල වූ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය ලැයිස්තුව


| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය | මූල්‍ය වර්ෂ අවසානය |
|---|---|---|
| 377 | තලවකැලේ ටී ස්ටේට් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 378 | ටැංජරීන් බීච් හොටෙල්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 379 | සී/ස තැප්රොබේන් සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 380 | ටී ස්මෝල් හෝල්ඩර්ස් ෆැක්ටරීස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 381 | සී/ස ටී ටෑන්ග් (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 382 | ටෙස් ඇග්‍රෝ පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 383 | සී/ස ටෙක්ස්ලන්ඩ් සෙන්ටර් (පෞද්) සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 384 | සී/ස ටෙක්ස්ප්‍රින්ට් ලංකා (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 385 | ටෙක්ස්චර්ඩ් ජර්සේ ලංකා පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 386 | සී/ස ද චර්ච් ඔෆ් ජීසස් ක්‍රිස්ට් ඔෆ් ලැටර් ඩේ සෙයින්ට්ස් සිලෝන් (ගැරන්ටි) සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 387 | සී/ස ද කළම්බු ඉන්ටර්නැෂනල් ස්කූල් (ශ්‍රී ලංකා) සමාගම | 2015 මාර්තු 31 |
| 388 | ද කැන්ඩි හොටෙල්ස් (1938) පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 389 | ද කින්ස්ග්බරි පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 390 | ද ලයිට්හවුස් හොටෙල්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 391 | සී/ස ද ඕවසීස් ස්කූල් ඔෆ් කළම්බු (ගැරන්ටි) සමාගම | 2015 ජූලි 31 |
| 392 | සී/ස ද රෝයල් හෙරිටේජ් හොටෙල් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 393 | ද ස්වදේශී ඉන්ඩස්ට්‍රියල් වර්ක්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 394 | සී/ස ද වීල්වර්ක්ස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 395 | ත්‍රී ආර්ක් ෆාම්ස් පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 396 | සී/ස ටී කේ එස් සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 397 | ටෝකියෝ සිමෙන්ට් (ලංකා) පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 398 | සී/ස ටෝයෝ කුෂන් ලංකා (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 399 | සී/ස ටොයෝටා ලංකා (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 400 | ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 401 | ට්‍රාන්ස් ඒෂියා හොටෙල්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 402 | සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝර්ඩ්ස් සොලියුෂන් (පෞද්) සමාගම | 2015 ජූනි 30 |
| 403 | සී/ස ට්‍රයිචෙල් ෆැබ්රික් (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 404 | සී/ස ට්‍රොපික් ෆ්‍රෝසම් ෆුඩ්ස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 405 | සී/ස ටෆ්ලයින් සමාගම | 2015 මාර්තු 31 |
| 406 | සී/ස ටී වී එස් ඔටෝ මෝටිව්ස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 407 | සී/ස යූබී ෆිනෑන්ස් සමාගම | 2016 මාර්තු 31 |
| 408 | සී/ස යූ පී ඒ එස්කේප්ස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 409 | සී/ස අල්ට්‍රාටෙච් සිමෙන්ට් ලංකා (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 410 | සී/ස යුනි දිල් පැකේජින් සමාගම | 2015 මාර්තු 31 |
| 411 | සී/ස යුනි දිල් පැකේජින් සමාගම | 2016 මාර්තු 31 |
| 412 | සී/ස යුනිවෙලා (පෞද්) සමාගම | 2014 දෙසැම්බර් 31 |

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය | මූල්‍ය වර්ෂ අවසානය |
|---|---|---|
| 413 | සී/ස යුනිවෙලා (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 414 | සී/ස යුනිලීවර් ලිප්ටන් සිලෝන් සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 415 | යූනියන් ඇෂුවරන්ස් පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 416 | යූනියන් කෙමිකල්ස් ලංකා පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 417 | සී/ස යූනියන් කැපිටල් ලීසිං සමාගම | 2016 මාර්තු 31 |
| 418 | යුනයිටඩ් මෝටර්ස් ලංකා පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 419 | සී/ස යුනයිටඩ් ටුබැකෝ ප්‍රොසෙසින් (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 420 | වැලිබල් වන් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 421 | සී/ස වර්තුසා (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 422 | සී/ස විෂන්ෆන්ඩ් ලංකා සමාගම | 2015 මාර්තු 31 |
| 423 | සී/ස වර්ල්ඩ්ඩොක් මැකනයිස්ඩ් සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 424 | සී/ස වොටර්ෆ්‍රන්ට් ප්‍රොපටීස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 425 | සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 426 | සී/ස ඩබ් එන් එස් ග්ලෝබල් සර්විසස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 427 | සී/ස වර්ල්ඩ් ඩියුටි ෆ්‍රී ග්‍රෑප් ලංකා සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 428 | සී/ස වයි කේ කේ ලංකා (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 429 | යෝර්ක් ආකේඩ් හෝල්ඩින්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |

# 2016 වර්ෂයේදී සමාලෝචිත මූල්‍ය ප්‍රකාශන අතරින් නිරීක්ෂණ සහිතව අනුකූල වූ, නිරීක්ෂණ ලිපි මගින් දැනුම් දෙන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය | මූල්‍ය වර්ෂ අවසානය |
|---|---|---|
| 1 | අබාන්ස් ඉලෙක්ට්‍රිකල්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 2 | සී/ස අබාන්ස් එන්වයර්මන්ටල් සර්විසස් (පෞද්) සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 3 | අබාන්ස් පොදු සමාගම | 2014 මාර්තු 31 |
| 4 | ඇක්සස් ඉන්ජිනියරින් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 5 | සී/ස ඇක්සස් ඉන්ටර්නැෂනල් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 6 | සී/ස ඒස්පවර් ඇඹිලිපිටිය (පෞද්) සමාගම | 2014 මාර්තු 31 |
| 7 | ඒ සී එම් ඊ ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 8 | ඒ සී එම් ඊ ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 9 | සී/ස ඇක්විටි පාට්නර්ස් (පෞද්) සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 10 | සී/ස ඇක්විටි සෙකියුරිටීස් සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 11 | සී/ස ඇක්විටි ස්ටොක් බ්‍රෝකර්ස් (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 12 | ඇඩම් කැපිටල් පොදු සමාගම | 2014 මාර්තු 31 |
| 13 | ඇඩම් කැපිටල් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 14 | සී/ස ආදම්ජී ලුක්මන්ජි සහ පුත්‍රයෝ (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 15 | සී/ස ආගරපතන ප්ලාන්ටේෂන් සමාගම | 2016 මාර්තු 31 |
| 16 | ඇග්‍රිකල්චර් ඉන්ෂුරන්ස් ස්කීම් | 2014 දෙසැම්බර් 31 |
| 17 | ඇග්ස්ටාර් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 18 | සී/ස ඒ අයි ඩී ඒ ජෙම්ස් ඇන්ඩ් ජුවලරි (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 19 | සී/ස අක්බාර් බ්‍රදර්ස් (පෞද්) සමාගම | 2013 මාර්තු 31 |
| 20 | සී/ස ඇලයිඩ් ප්‍රොපටීස් (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 21 | සී/ස ඇමරිකන් ඇන්ඩ් එෆර්ඩ් ලංකා (පෞද්) සමාගම | 2014 සැප්තැම්බර් 30 |
| 22 | සී/ස ඇමරිකන් ඇන්ඩ් එෆර්ඩ් ලංකා (පෞද්) සමාගම | 2015 සැප්තැම්බර් 30 |
| 23 | ආර්පිකෝ ඇටරාක්ෂියා කෑෂ් මැනේජ්මන්ට් ට්‍රස්ට් ෆන්ඩ් | 2015 මාර්තු 31 |
| 24 | ඇස්කොට් හෝල්ඩින්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 25 | සී/ස ඒෂියා බ්‍රෝඩ්කාස්ටින් කෝපරේෂන් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 26 | සී/ස ඒෂියා පැසිපික් ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි ලංකා (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 27 | සී/ස ඒෂියා සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 28 | සී/ස ඒෂියන් ෆිනෑන්ස් සමාගම | 2015 මාර්තු 31 |
| 29 | සී/ස ඇසෝසියේටඩ් සීටී (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 30 | බයිරහා ෆාම්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 31 | බලංගොඩ ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 32 | බාට්ලීට් ෆිනෑන්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 33 | සී/ස බී ඒ එස් එෆ් ලංකා (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 34 | සී/ස බාටා ෂු කම්පැණි ඔෆ් සිලෝන් | 2015 දෙසැම්බර් 31 |
| 35 | බේරුවල රිසෝර්ට් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 36 | බිම්පුත් ෆිනෑන්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 37 | බිලු ඩයමන්ඩ් ජුවලර් වර්ල්ඩ්වයිඩ් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 38 | සී/ස බ්ලූ ඕසන් රෙසිඩන්සීස් (පෞද්) සමාගම | 2014 මාර්තු 31 |
| 39 | සී/ස බිල්ඩින් මැටීරියල්ස් කෝපරේෂන් සමාගම | 2013 දෙසැම්බර් 31 |
| 40 | සීටී හෝල්ඩින්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 41 | සී/ස කැපිටල් අලියාන්ස් සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 42 | සී/ස කැපිටල් ට්‍රස්ට් සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 43 | සී/ස කැප්ටන් ස්ටීල් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 44 | සී/ස කාර්ගිල්ස් ඇග්‍රි ෆුඩ්ස් සමාගම | 2015 මාර්තු 31 |
| 45 | සී/ස කාර්ගිල්ස් කොලිටි ඩේයරීස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 46 | සී/ස කාර්ගිල්ස් කොලිටි ෆුඩ්ස් සමාගම | 2015 මාර්තු 31 |
| 47 | සී/ස සීඊපී එඩියුකේෂන් හෝල්ඩින්ස් (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 48 | සී/ස සර්ටිස් ලංකා සෙකියුරිටි සොලියුෂන් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 49 | සේබෑන්ක් සෙන්චරි ග්‍රෝත් ෆන්ඩ් | 2015 මාර්තු 31 |
| 50 | සී/ස සෙලින්කෝ සමාගම | 2014 මාර්තු 31 |
| 51 | සී/ස සිලෝන් ඇසෙස්ට් මැනේජ්මන්ට් සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 52 | සී/ස සිලොන් ඔටෝ ඉන්ඩස්ට්‍රියල් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 53 | සී/ස සිලෝන් බෙවරේජ් හෝල්ඩින්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 54 | සී/ස සිලෝන් බල්බ්ස් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස් සමාගම | 2015 මාර්තු 31 |
| 55 | සිලෝන් ඉලෙක්ට්‍රිසිටි බෝඩ් | 2014 දෙසැම්බර් 31 |
| 56 | සී/ස සිලෝන් ෆර්ටිලයිසර් සමාගම | 2015 මාර්තු 31 |
| 57 | සිලෝන් හොස්පිටල්ස් පොදු සමාගම | 2014 මාර්තු 31 |
| 58 | සිලෝන් හොස්පිටල්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 59 | සිලෝන් හොස්පිටල්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 60 | සිලෝන් හොටෙල්ස් කෝපරේෂන්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 61 | සිලෝන් පෙට්‍රෝලියම් කෝපරේෂන් | 2013 දෙසැම්බර් 31 |
| 62 | සිලෝන් පෙට්‍රෝලියම් කෝපරේෂන් | 2014 දෙසැම්බර් 31 |
| 63 | සී/ස සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් සමාගම | 2013 දෙසැම්බර් 31 |
| 64 | සී/ස සිලෝන් පෙට්‍රෝලියම් ස්ටොරේජ් ටර්මිනල්ස් සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 65 | සී/ස සිලෝන් පේපර් සැක්ස් සමාගම | 2013 මාර්තු 31 |
| 66 | සිලෝන් ප්‍රින්ටර්ස් පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 67 | සී/ස සිලෝන් වෙයාහවුස් කම්ප්ලෙක්ස් (පෞද්) සමාගම | 2013 දෙසැම්බර් 31 |
| 68 | සී/ස සිලෝන් වෙයාහවුස් කම්ප්ලෙක්ස් (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 69 | චිලව් ෆිනෑන්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 70 | චිලව් ෆිනෑන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 71 | සී/ස සිටිහෙල්ත් ඉම්පෝර්ට් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 72 | සී/ස කෝට්ස් ත්‍රෙඩ් ලංකා (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 73 | කලම්බු සිටි හෝල්ඩින්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 74 | සී/ස කළම්බු ෆෝට් හොටෙල්ස් සමාගම | 2015 මාර්තු 31 |
| 75 | කොම්ට්‍රස්ට් ඉක්විටි ෆන්ඩ් | 2015 මාර්තු 31 |




# 2016 වර්ෂයේදී සමාලෝචිත මූල්‍ය ප්‍රකාශන අතරින් නිරීක්ෂණ සහිතව අනුකූල වූ, නිරීක්ෂණ ලිපි මගින් දැනුම් දෙන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය | මූල්‍ය වර්ෂ අවසානය |
|---|---|---|
| 76 | සී/ස කෝපරේටිව් ලීසිං සමාගම | 2015 මාර්තු 31 |
| 77 | සී/ස ක්‍රිස්ටල් මාටිං සෙන්ට්‍රල් (පෞද්) සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 78 | සී/ස ක්‍රිස්ටල් මාටිං සිලෝන් (පෞද්) සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 79 | සී/ස ක්‍රිස්ටල් මාටිං ගාමන්ට්ස් (පෞද්) සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 80 | සී ටී ලෑන්ඩ් ඩිවලොප්මන්ට් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 81 | සී/ස ඩී ආර් හෝම් ඇප්ලයන්ස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 82 | සී/ස දම්රෝ (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 83 | සී/ස ඩාර්ලි බට්ලර් සහ සමාගම | 2016 මාර්තු 31 |
| 84 | සී/ස ඩේවිඩ් පීරිස් ඔටෝ මොබයිල් සමාගම | 2015 මාර්තු 31 |
| 85 | සී/ස ඩේවිඩ් පීරිස් මෝටර් සමාගම | 2015 මාර්තු 31 |
| 86 | සී/ස ඩීන් ෆෝස්ටර්ස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 87 | ඩිවලප්මන්ට් ලොටරිස් බෝඩ් | 2014 දෙසැම්බර් 31 |
| 88 | සී/ස ඩිවලප්මන්ට් හෝල්ඩින්ස් (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 89 | ඩී එෆ් සී සී බෑන්ක් පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 90 | සී/ස ඩයනා ට්‍රේඩින් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 91 | සී/ස දික්වැල්ල රිසෝට් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 92 | සී/ස දික්වැල්ල රිසෝට් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 93 | සී/ස දියෙතේම් ට්‍රැවල් ලංකා (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 94 | සී/ස දියෙතේම් ට්‍රැවල් ලංකා (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 95 | සී/ස ඩී පී එල් ප්ලාන්ටේෂන්ස් (පෞද්) සමාගම | 2014 මාර්තු 31 |
| 96 | සී/ස ඩී පී එල් ප්ලාන්ටේෂන්ස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 97 | සී/ස ඩී ආර් ඉන්ඩස්ට්‍රීස් (පෞද්) සමාගම | 2014 මාර්තු 31 |
| 98 | දුනමිස් කැපිටල් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 99 | සී/ස ඊස්ටන් ඩිවලප්මන්ට් එන්ටර්ප්‍රයිසස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 100 | ඊස්ටන් මර්චන්ට්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 101 | ඊඩ්න් හොටෙල් ලංකා පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 102 | සී/ස එනජයිසර් ලංකා සමාගම | 2014 සැප්තැම්බර් 30 |
| 103 | සී/ස එනපි ලංකා හෝල්ඩින්ස් සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 104 | ඉක්විටි වන් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 105 | සී/ස එක්ස්පෝ ලංකා (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 106 | සී/ස එක්ස්පෝ ලංකා ෆ්‍රෙයිට් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 107 | සී/ස එක්ස්පෝ ලංකා ටීස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 108 | සී/ස ඊසි ඩිස්ට්‍රිබියුෂන් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 109 | ෆාමර්ස් පෙන්ෂන් ඇන්ඩ් ශෝෂල් සෙකියුරිටි බෙනිෆිට් ස්කීම් | 2014 දෙසැම්බර් 31 |
| 110 | සී/ස ෆැෂන්බග් ලංකා (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 111 | සී/ස ෆේවරිට් ගාමන්ට්ස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 112 | සී/ස ෆස්ට් කැපිටල් ඇසෙස්ට් මැනේජ්මන්ට් සමාගම | 2015 මාර්තු 31 |
| 113 | ෆස්ට් කැපිටල් හෝල්ඩින්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 114 | සී/ස ෆස්ට් ගාඩියන් ඉක්විටීස් (පෞද්) සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 115 | ෆිෂර්මන්ස් පෙන්ෂන් ඇන්ඩ් ශෝෂල් සෙකියුරිටි බෙනිෆිට් ස්කීම් | 2014 දෙසැම්බර් 31 |
| 116 | සී/ස ෆිට්ස් ඒවියේෂන්ස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 117 | ගලධාරී හොටෙල්ස් (ලංකා) පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 118 | සී/ස ගාමිණී ඇන්ඩ් බ්‍රදර්ස් (පෞද්) සමාගම | 2014 මාර්තු 31 |
| 119 | සී/ස ග්ලෝබල් ඉන්ටිමේට්ස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 120 | සී/ස පී පී ඩි සිල්වා ඇන්ඩ් සන්ස් ඉන්ටර්නැෂනල් (පෞද්) සමාගම | 2013 මාර්තු 31 |
| 121 | සී/ස ග්‍රොසාට් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 122 | සී/ස හාකෝර්ට්ස් (පෞද්) සමාගම | 2014 මාර්තු 31 |
| 123 | හරිස්චන්ද්‍ර මිල්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 124 | හැටන් නැෂනල් බෑන්ක් පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 125 | හේලීස් කන්සියුමර් ප්‍රොඩක්ට්ස් සමාගම | 2015 මාර්තු 31 |
| 126 | සී/ස හේලීස් ප්ලාන්ටේෂන්ස් සර්විසස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 127 | හේලීස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 128 | එච් ඩී එෆ් සී බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා | 2014 දෙසැම්බර් 31 |
| 129 | එච් ඩී එෆ් සී බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා | 2015 දෙසැම්බර් 31 |
| 130 | සී/ස හේමාස් කැපිටල් හොස්පිටල් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 131 | සී/ස හෙම්ටුවර්ස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 132 | සී/ස හයිඩ්‍රාමණි ඉන්ඩස්ට්‍රීස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 133 | සී/ස හයිඩ්‍රාමණි ඉන්ටර්නැෂනල් එක්ස්පෝර්ට්(පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 134 | සී/ස හයිඩ්‍රාමණි මර්කරි ඇපරල් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 135 | සී/ස එච්ජේ එස් කොන්ඩිමන්ට්ස් සමාගම | 2016 මාර්තු 31 |
| 136 | හොටෙල් සීගිරිය පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 137 | හන්ටර්ස් ඇන්ඩ් කම්පැණි පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 138 | ඉන්ඩස්ට්‍රියල් ඇස්පල්ට්ස් (ලංකා) පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 139 | සී/ස ඉන්ටර් බ්‍රෂ් ලංකා සමාගම | 2015 මාර්තු 31 |
| 140 | සී/ස ඉන්ටර්ටී (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 141 | සී/ස ඉසුරු ලීසිං සමාගම | 2013 මාර්තු 31 |
| 142 | සී/ස ඉසුරු ලීසිං සමාගම | 2014 මාර්තු 31 |
| 143 | සී/ස ඉසුරු ලීසිං සමාගම | 2015 මාර්තු 31 |
| 144 | ජේ සෙ ටී (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 145 | සී/ස ජේ එෆ් ඇන්ඩ් පැකේජින් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 146 | සී/ස ජාඩා රිසෝට් ඇන්ඩ් ස්පා (පෞද්) සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 147 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 148 | කළමාසු සිස්ටම්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 149 | සී/ස කැන්රිච් ෆයිනෑන්ස් සමාගම | 2014 මාර්තු 31 |
| 150 | කේ බී එස් එල් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජීස් සමාගම | 2015 මාර්තු 31 |
| 151 | සී/ස කෙපෙල් සීටී ඩිවලොප්මන්ට්ස් (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |

# 2016 වර්ෂයේදී සමාලෝචිත මූල්‍ය ප්‍රකාශන අතරින් නිරීක්ෂණ සහිතව අනුකූල වූ, නිරීක්ෂණ ලිපි මගින් දැනුම් දෙන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය | මූල්‍ය වර්ෂ අවසානය |
|---|---|---|
| 152 | සී/ස කොග්ගල මැනුෆැක්චරින් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 153 | කොටගල ප්ලාන්ටේෂන් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 154 | ලේඩි ලෝහෝර් ණය අරමුදල | 2014 දෙසැම්බර් 31 |
| 155 | ලංකා ඇලුමිනියම් ඉන්ඩස්ට්‍රීස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 156 | ලංකා ඇලුමිනියම් ඉන්ඩස්ට්‍රීස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 157 | ලංකා සිමෙන්ට් පොදු සමාගම | 2013 දෙසැම්බර් 31 |
| 158 | ලංකා සෙරමික් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 159 | ලංකා මිල්ක් ෆුඩ්ස් (සීඩබ්ඊ) පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 160 | සී/ස ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 161 | ලංකෙම් සිලෝන් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 162 | සී/ස ලාෆ් එකෝ ශ්‍රී (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 163 | එල් බී ෆිනෑන්ස් පොදු සමාගම | 2013 මාර්තු 31 |
| 164 | එල් බී ෆිනෑන්ස් පොදු සමාගම | 2014 මාර්තු 31 |
| 165 | සී/ස ලිබර්ටි හෝල්ඩින්ස් සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 166 | ලයන් බෲවරි සිලෝන් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 167 | සී/ස ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (පෞද්) සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 168 | ලෝඩ්ස්ටාර් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 169 | සී/ස  ලොගිවෙන්චර්ස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 170 | එල් ඕ එල් සී මයික්‍රො ක්‍රෙඩිට් සමාගම | 2015 මාර්තු 31 |
| 171 | එල් ඕ එල් සී මයික්‍රො ක්‍රෙඩිට් සමාගම | 2016 මාර්තු 31 |
| 172 | මැක්වුඩ්ස් එනර්ජි පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 173 | මාඩොල්සිම ප්ලාන්ටේෂන් පොදු සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 174 | සී/ස මැස්කන් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 175 | සී/ස  මෙල්බන් ටෙක්ස්ටයිල් වොෂින් ප්ලාන්ට් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 176 | මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා අන්ඩ් ෆයිනෑන්ස් පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 177 | සී/ස මියාමි ක්ලෝතින්ග් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 178 | සී/ස මියාමි එක්ස්පෝට් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 179 | සී/ස මයික්‍රොසොෆ්ට් ශ්‍රී ලංකා (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 180 | සී/ස මිලේනියම් ඉන්ෆෝමේෂන් ටෙක්නොලොජිස් (පෞද්) සමාගම | 2014 මාර්තු 31 |
| 181 | සී/ස මිලේනියම් ඉන්ෆෝමේෂන් ටෙක්නොලොජිස් (පෞද්) සමාගම | 2013 දෙසැම්බර් 31 |
| 182 | සී/ස මිලේනියම් අයිටී සොෆ්ට්වෙයාර් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 183 | මිලර්ස් සමාගම | 2015 මාර්තු 31 |
| 184 | එම්ටීඩී වෝල්කර්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 185 | මුලර් ඇන්ඩ් පිලිප්ස් (ලංකා) පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 186 | මල්ටි ෆයිනෑන්ස් පොදු සමාගම | 2013 මාර්තු 31 |
| 187 | මල්ටි ෆයිනෑන්ස් පොදු සමාගම | 2014 මාර්තු 31 |
| 188 | සී/ස එන්ඒබල් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 189 | නේෂන් ලංකා ෆයිනෑන්ස් පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය | මූල්‍ය වර්ෂ අවසානය |
|---|---|---|
| 190 | සී/ස එන්ඩීබී සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 191 | සී/ස නිව් නවලෝක මෙඩිකල් සෙන්ටර් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 192 | සී/ස නයින්වෙල්ස් කෙයාර් මදර් ඇන්ඩ් බේබි හොස්පිටල් (පෞද්) සමාගම | 2014 මාර්තු 31 |
| 193 | සී/ස නිවාසී ඩිවලොපර්ස් මාලඹේ (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 194 | සී/ස නෝදර්න් පවර් කම්පැණි (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 195 | ඔෆිස් ඉක්විප්මන්ට්ස් පොදු සමාගම | 2013 මාර්තු 31 |
| 196 | ඔනාලි හෝල්ඩින්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 197 | ඔරියන්ට් ගාමන්ට්ස් පොදු සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 198 | සී/ස පැක්වෙල් ලංකා (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 199 | පැරගන් සිලෝන් පොදු සමාගම | 2014 මාර්තු 31 |
| 200 | සී/ස පරන්තන්ස් කෙමිකල්ස් සමාගම | 2015 මාර්තු 31 |
| 201 | සී/ස පෙන්ගුයින් ස්පෝර්ට්ස්වෙයාර් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 202 | පීපල්ස් ෆයිනෑන්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 203 | පීපල්ස් මර්චන්ට්ස් ෆයිනෑන්ස් පොදු සමාගම | 2013 දෙසැම්බර් 31 |
| 204 | පීපල්ස් මර්චන්ට්ස් ෆයිනෑන්ස් පොදු සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 205 | සී/ස පර්ෆෙට් වෑන් මෙලී ලංකා (පෞද්) සමාගම | 2013 දෙසැම්බර් 31 |
| 206 | ෆීනික්ස් ඉන්ඩසට්‍රීස් සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 207 | සී/ස ෆියෙස්ට්‍රා ෆර්නිචර් (පෞද්) සමාගම | 2013 මාර්තු 31 |
| 208 | පොලිටෙක්ස් ගාමන්ට්ස් සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 209 | සී/ස ප්‍රයිම් ලෑන්ඩ්ස් (පෞද්) සමාගම | 2013 දෙසැම්බර් 31 |
| 210 | ප්‍රින්ට්කෙයාර් පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 211 | සී/ස ප්‍රින්ට්කෙයාර් යුනිවර්ෂල් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 212 | සී/ස ප්‍රොක්ටර් ඇන්ඩ් ගැම්බල් ලංකා (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 213 | සී/ස පල්සස් ස්පිල්ටිං ඇන්ඩ් ප්‍රොසෙසින් ඉන්ඩස්ට්‍රී (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 214 | සී/ස පුස්සැල්ල මීට් ප්‍රොඩියුසර්ස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 215 | පුස්සැල්ලාව ප්ලාන්ටේෂන්ස් සමාගම | 2015 මාර්තු 31 |
| 216 | සී/ස කොලිටි සිලෝන් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 217 | රේඩියන්ට් ජෙම්ස් ඉන්ටර්නැෂනල් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 218 | රයිගම් වයඹ සෝල්ටන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 219 | රම්බොඩ ෆෝල්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 220 | රෙකිට් බෙන්කිසර් (ලංකා) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 221 | රේණුකා හෝල්ඩින්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 222 | රෙසස් එනර්ජි පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 223 | රයිනෝ රූෆින් ප්‍රඩක්ට්ස් සමාගම | 2015 මාර්තු 31 |
| 224 | රිචඩ් පරිස් ඩිස්ට්‍රිබියුටර්ස් සමාගම | 2016 මාර්තු 31 |
| 225 | සී/ස රෝස්වුඩ් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 226 | සී/ස ෂෙනෙයිඩර් ඉලෙක්ට්‍රික්ස් ලංකා (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |



2016 වර්ෂයේදී සමාලෝචිත මූල්‍ය ප්‍රකාශන අතරින් නිරීක්ෂණ සහිතව අනුකූල වූ, නිරීක්ෂණ ලිපි මගින් දැනුම් දෙන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය | මූල්‍ය වර්ෂ අවසානය |
|---|---|---|
| 227 | සී/ස සෙනොක් ට්‍රේඩ් කම්බයින් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 228 | සෙරන්ඩිබ් හොටෙල්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 229 | සෙරන්ඩිබ් ඉංජිනියරින් ග්‍රෑප් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 230 | සී/ස ෂන්බේ ජීන්ස් කෝපරේෂන්ස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 231 | සී/ස සියෙරා කන්ස්ට්‍රක්ෂන්ස් (පෞද්) සමාගම | 2014 මාර්තු 31 |
| 232 | සී/ස සිලියුටා (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 233 | සී/ස සින්ග්වර්ල්ඩ් ලංකා (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 234 | සිංහ පුත්‍ර ෆිනෑන්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 235 | සී/ස සයිනෝ ලංකා (පෞද්) සමාගම | 2014 මාර්තු 31 |
| 236 | එස් එම් බී ලීසිං පොදු සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 237 | එස් එම් බී ලීසිං පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 238 | සී/ස එස් එම් බී සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 239 | සී/ස සොෆ්ට්ලොජික් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජීස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 240 | සී/ස සොෆ්ට්ලොජික් ස්ටෝක්බ්‍රෝකර්ස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 241 | සී/ස සමර්විල් ස්ටොක්බ්‍රෝකර්ස් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 242 | සී/ස ස්පෙවිල් සිලෝන් (පෞද්) සමාගම | 2013 දෙසැම්බර් 31 |
| 243 | සී/ස ස්පයිස් ඔෆ් ලයිෆ් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 244 | ශ්‍රී ලංකා ආයුර්වේදික් ඩ්‍රග්ස් කෝපරේෂන්ස් | 2014 දෙසැම්බර් 31 |
| 245 | ශ්‍රී ලංකා බ්‍රෝඩ්කාස්ටින් කෝපරේෂන් | 2014 දෙසැම්බර් 31 |
| 246 | ශ්‍රී ලංකා කැෂූ කෝපරේෂන් | 2014 දෙසැම්බර් 31 |
| 247 | ශ්‍රී ලංකා එක්ස්පෝර්ට් ක්‍රෙඩිට්ස් ඉන්ෂුරන්ස් කෝපරේෂන් | 2014 දෙසැම්බර් 31 |
| 248 | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්ස්ටයිල් ඇන්ඩ් ඇපරල් | 2013 දෙසැම්බර් 31 |
| 249 | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්ස්ටයිල් ඇන්ඩ් ඇපරල් | 2014 දෙසැම්බර් 31 |
| 250 | ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | 2014 දෙසැම්බර් 31 |
| 251 | ශ්‍රී ලංකා ලෑන්ඩ් රෙක්ලමේෂන් ඇන්ඩ් ඩිවලොප්මන්ට් කෝපරේෂන් | 2012 දෙසැම්බර් 31 |
| 252 | ශ්‍රී ලංකා ලෑන්ඩ් රෙක්ලමේෂන් ඇන්ඩ් ඩිවලොප්මන්ට් කෝපරේෂන් | 2013 දෙසැම්බර් 31 |
| 253 | ශ්‍රී ලංකා රූපවාහිනී කෝපරේෂන් | 2014 දෙසැම්බර් 31 |
| 254 | ශ්‍රී ලංකා සේවින්ස් බෑන්ක් සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 255 | ශ්‍රී ලංකා ස්ටේට් ට්‍රේඩින් (ජෙනරල්) කෝපරේෂන් සමාගම | 2015 මාර්තු 31 |
| 256 | ස්ටේට් මෝගේජ් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් බෑන්ක් | 2014 දෙසැම්බර් 31 |
| 257 | ස්ටේට් ෆාමර්සෙයුටිකල්ස් කෝපරේෂන්ස් ඔෆ් ශ්‍රී ලංකා | 2012 දෙසැම්බර් 31 |
| 258 | ස්ටේට් ෆාමර්සෙයුටිකල්ස් කෝපරේෂන්ස් ඔෆ් ශ්‍රී ලංකා | 2013 දෙසැම්බර් 31 |
| 259 | ස්ටේට් ප්‍රින්ටින් කෝපරේෂන්ස් | 2012 දෙසැම්බර් 31 |
| 260 | ස්ටේට් ප්‍රින්ටින් කෝපරේෂන්ස් | 2014 දෙසැම්බර් 31 |
| 261 | ස්ටේට් ටිම්බර් කෝපරේෂන්ස් | 2014 දෙසැම්බර් 31 |
| 262 | ස්ටේට් ටිම්බර් කෝපරේෂන්ස් | 2015 දෙසැම්බර් 31 |
| 263 | සී/ස සුමිකෝ ලංකා හොටෙල්ස් (පෞද්) සමාගම | 2013 මාර්තු 31 |

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය | මූල්‍ය වර්ෂ අවසානය |
|---|---|---|
| 264 | සන්ග්‍රෝ ලයිෆ් සයන්ස් සමාගස | 2015 මාර්තු 31 |
| 265 | ෂන්ශයින් හෝල්ඩින්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 266 | සී/ස සන්ටී (පෞද්) සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 267 | ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 268 | සී/ස ස්වීඩිෂ් ට්‍රේඩින් කම්පැණි (පෞද්) සමාගම | 2014 මාර්තු 31 |
| 269 | ටැප්ප්‍රොබේන් හෝල්ඩින්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 270 | සී/ස ටෙක්ස්ප්‍රෝ ඉන්ඩස්ට්‍රීස් සමාගම | 2015 මාර්තු 31 |
| 271 | සී/ස ටෙක්ස්ප්‍රෝ ඉන්ඩස්ට්‍රීස් සමාගම | 2016 මාර්තු 31 |
| 272 | සී/ස ටෙක්ස්ටයිල් ඉන්ටර්නැෂනල් කළම්බු (පෞද්) සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 273 | ද නුවරඑළිය හොටෙල්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 274 | සී/ස ටී කේ එස් ෆිනෑන්ස් සමාගම | 2016 මාර්තු 31 |
| 275 | සී/ස ටෝකියෝ සුපර් සිමෙන්ට් කම්පැණි ලංකා (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 276 | සී/ස ට්‍රිලියම් රෙසිඩන්සීස් සමාගම | 2014 මාර්තු 31 |
| 277 | සී/ස ට්‍රිලියම් රෙසිඩන්සීස් සමාගම | 2015 මාර්තු 31 |
| 278 | සී/ස ට්‍රොපික් ෆිෂරි (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 279 | සී/ස යූනියන් ඇෂුවරන්ස් ජෙනරල් සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 280 | යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පොදු සමාගම | 2015 දෙසැම්බර් 31 |
| 281 | සී/ස යුසි ලංකා (පෞද්) සමාගම | 2014 දෙසැම්බර් 31 |
| 282 | සී/ස වෙචන්සන් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 283 | විදුල්ලංකා පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 284 | වොකේෂනල් ට්‍රේනින් ඔතෝරිටි ඔෆ් ශ්‍රී ලංකා | 2013 දෙසැම්බර් 31 |
| 285 | සී/ස වෝග් ජුවලර්ස් (පෞද්) සමාගම | 2016 මාර්තු 31 |
| 286 | සී/ස වීටී මැනුෆැක්චරින් (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 287 | සී/ස ඩබ්.එම්. මෙන්ඩිස් සහ සමාගම | 2015 මාර්තු 31 |
| 288 | වෝල්කර්ස් පයිලිං (පෞද්) සමාගම | 2015 මාර්තු 31 |
| 289 | වටවල ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2015 මාර්තු 31 |
| 290 | වටවල ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2016 මාර්තු 31 |
| 291 | සී/ස වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් සමාගම | 2016 මාර්තු 31 |
| 292 | සී/ස යන්ග් ඇන්ඩ් ඉන්ටර්නැෂනල් ලංකා (පෞද්) සමාගම | 2013 දෙසැම්බර් 31 |

# 2016 දෙසැම්බර් 31 දිනට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකරන ලද ලැයිස්තුගත සමාගම් සහ රාජ්‍ය ආයතන

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ලැයිස්තුගත සමාගම්

- අගලවත්ත ප්ලාන්ටේෂන් පොදු සමාගම
- ලංකා සිමෙන්ති පොදු සමාගම*
- වනික් ඉන්කෝපරේෂන් පොදු සමාගම**

2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ලැයිස්තුගත සමාගම්

- එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පොදු සමාගම**
- ස්ටෑන්ඩර්ඩ් කැපිටල් පොදු සමාගම
- මිරාමා බීච් හොටෙල් පොදු සමාගම **
- පී සී ෆාමා පොදු සමාගම **
- පී සී හවුස් පොදු සමාගම **
- පැලවත්ත ෂුගර් ඉන්ඩස්ට්‍රීස් පොදු සමාගම
- සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පොදු සමාගම **

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ රාජ්‍ය අංශයේ ආයතන

- ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථා සමාගම
- මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යංශය
- ලංකා පිඟන් සංස්ථාව
- ලංකා විදුලිබල මණ්ඩලය
- ලංකා ධීවර  සංස්ථාව
- ලංකා ඛනිජතෙල්  සංස්ථාව
- පොල් වගාකිරීමේ මණ්ඩලය
- සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
- ජනතා වතු සංවර්ධන මණ්ඩලය
- දේශීය ණය සහ සංවර්ධන මණ්ඩලය
- ජාතික චිත්‍රපටි සංස්ථාව
- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
- ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය
- ජාතික ව්‍යාපාරිත්ව කළමනාකරණ ආයතනය
- ජාතික ලොතරැයි මණ්ඩලය
- ජාතික රක්ෂණ භාර අරමුදල
- වී අලෙවි මණ්ඩලය
- ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල
- ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
- ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
- ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
- ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත සහ ඇඟළුම් ආයතනය
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
- ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව
- රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීම් සංස්ථාව
- ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව
- රාජ්‍ය දැව සංස්ථාව
- රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
- සමූපකාර තොග වෙළඳ සංස්ථාව
- නාගරික සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ රාජ්‍ය අංශයේ ආයතන

- ජාතික කඩදාසි සමාගම
- ලංකා නැව් සංස්ථාව
- ලංකා පොහොර සමාගම

* වර්තමානයේ කොළඹ කොටස් හුවමාරුවේ (CSE) පැහැර හැරීම් පුවරුවේ ඇතුළත් ආයතන.

** වර්තමානයේ කොළඹ කොටස් හුවමාරුවේ (CSE) පැහැර හැරීම් පුවරුවේ ඇතුළත් වන අතර, ව්‍යාපාරික කටයුතු සිදු නොකරන ආයතන.



# 2016 වසර තුළ විගණන සමාලෝචන වලදී කරන ලද නිරීක්ෂණ

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විගණන පරීක්ෂණ (මින් පෙර විගණන සමාලෝචන වශයෙන් හඳුන්වන ලද) සිදුකිරීමේ ප්‍රවේශය 2016 සැප්තැම්බර් මාසයේ සිට අවදානම් පාදක වඩා පුළුල් ප්‍රවේශයක් කරා වෙනස් කරන ලදී. එක්සත් රාජධානියේ භාවිතා වන විගණන රෙගුලාසි පිළිබඳ මනා දැනුමක් ඇති ජාත්‍යන්තර උපදේශකයෙකු මගින් තාක්ෂණික කාර්යමණ්ඩලය ලබාගත් පුළුල් දැනුම මෙකී වෙනස සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

අවුරුද්දේ පළමු මාස නමය තුළ අනුගමනය කළ පරීක්ෂණ ප්‍රවේශය යටතේ විගණනය සිදුකිරීමේ දී විගණකවරුන් විසින් විගණන ප්‍රමිතිවලට අනුකූලවීමේ සමස්ත මට්ටම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට සමාලෝචනයේ යෙදී සිටි කාර්යමණ්ඩලයට පහසුකම් සැලසුණි. නමුත් සංශෝධිත ප්‍රවේශය මගින් හඳුන්ගන්නා ලද දැඩි අවධානම් ක්ෂේත්‍ර පිළිබඳ වඩා ගැඹුරින් පරීක්ෂණ සිදු කිරීමටත් පරීක්ෂණයේ ප්‍රමාණය පිළිබඳ සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම සඳහාත් පහසුකම් සලසයි.

## 2. පරීක්ෂණ සොයාගැනීම්

ඉකුත් වර්ෂයේ ආයතන 29 ක් විසින් සිදුකරන ලද විගණන 91 ක පරීක්ෂා කිරීම් හා සැසඳීමේ දී 2016 වර්ෂයේ දී ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් ආයතන 14 ක් විසින් සිදුකරන ලද විගණන 99 ක් පරීක්ෂා කරන ලදී. පරීක්ෂා කරන ලද විගණනයන් තුළ ජාත්‍යන්තර ජාලයන්හි සමාජිකත්වය දරනු ලබන ආයතන 4 ක් විසින් සිදු කරන ලද විගණන 81 ක් ඇතුළත් විය. පරීක්ෂා කරන ලද විගණන 6 ක් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් 10 කට වඩා අඩු ප්‍රමාණයක විගණන කටයුතු සිදුකරන ආයතන 5 ක් විසින් සිදු කර තිබුණි. විගණනවලින් 58% ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූල නොවූ ඒවා වශයෙන් හඳුනා ගන්නා ලද අතර විගණන 41% ක් අනුකූල වූ විගණන වශයෙන් හඳුනා ගන්නා ලදී.  තවද පරීක්ෂණ මත පදනම්ව විගණන 8 කට අදාළව වැඩිදියුණු කිරීම් සඳහා වන යෝජනා ආයතන 3ක් වෙත ඉදිරිපත් කරනු ලැබීය. එම යෝජනා විගණකවරුන්ට තම අනාගත විගණන කටයුතු වැඩිදියුණු කරගැනීම සඳහා උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 3. නැවත විගණනය කිරීම සඳහා නියෝග කිරීම

වර්ෂය තුල විගණන දෙකකට අදාළව සැලකිය යුතු අනුකූල නොවීම් නිරීක්ෂණය වූ අතර සිය මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කරගන්නා ලෙස නියම කරමින් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් මෙකී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්වලට නියෝග නිකුත් කරන ලදී. එම වර්ෂයේ වාර්ෂික වාර්තාව ලැබුණු සියලුම පාර්ශවයන් වෙත යළි විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල පිටපත් ප්‍රකාශයට පත්කර බෙදාහරින ලෙස මෙකී සමාගම්වලට නියම කරන ලදී.

## 4. විමර්ශන සඳහා යොමුකිරීම

විගණන විමර්ශනවලින් අනතුරුව එසේ හඳුනා ගන්නා ලද අවධානම්වල වැදගත්කම හේතුවෙන් එක් විගණනයක් විමර්ශනය සඳහා යොමු කරන ලදී.

## 5. විගණන පරීක්ෂණ සම්බන්ධයෙන් කරන ලද නිරීක්ෂණ

විගණන ආයතන 12 ක් විසින් සිදුකරන ලද විගණන 55 ක අඩු පාඩු හඳුනාගන්නා ලදී. සොයාගනු ලැබූ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලින් බැහැර වූ අවස්ථා පිළිබඳව අදාළ ආයතන වෙත උපකාරක ලිපි ස්වරූපයෙන් දැනුම් දෙන ලදී. ප්‍රධාන සොයාගැනීම් පහත සඳහන් පරිදි වේ.

### 5.1 ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට අපොහොසත් වීම.

මූල්‍ය ප්‍රකාශන සැදැහුම් තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගනු පිණිස විගණන ක්‍රියාපටිපාටි අනුගමනය කළ බවට සාක්ෂි විගණන 34 කට අදාළ විගණන කාර්ය පත්‍රිකා ලිපිගොනු තුළ අඩංගු නොවීය.

**ඌණතාවයන්ට පහත සඳහන් දෑ ඇතුළත් විය**

- ඇතැම් මූල්‍ය ප්‍රකාශන සැදැහුම් තහවුරු කිරීම පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා විගණන ක්‍රියාපටිපාටි අනුගමනය කිරීමට අපොහොසත් වීම.

  **උදාහරණ:**

  - ❍ දේපල සංවර්ධන සමාගමක් විසින් එක බිම් කට්ටියකට අදාළව අලෙවි ගිවිසුම් කිහිපයකට එළඹ නැති බවට තහවුරු නොගැනීම.
  - ❍ ශුද්‍ර මූල්‍ය ණයවලට අදාළව හානිකරණ දර්ශක පරීක්ෂා නොකිරීම.
  - ❍ සෘජු තහවුරුකිරීම් ලබා ගැනීම මගින් සම්බන්ධිත පාර්ශවයන්ගේ පැවත්ම තහවුරු කර නොග ැනීම.
  - ❍ භෞතික සමීක්ෂණයට සහභාගිවීම මගින් භාණ්ඩ තොග ගණනයට අදාළ නිරවද්‍යතාවය සහ පරිපූර්ණත්වය පැවතීම, භාණ්ඩ තොග වටිනාකම් පිළිබඳ නිරවද්‍යතාවය සහ පරිපූර්ණත්වය පිළිබ= සත්‍යෙක්ෂණය කිරීම සහ ආයතනයේ භාණ්ඩ තොග වාර්තා සම්බන්ධයෙන් විගණන පරිපාටි ප්‍රකාරව කටයුතු නොකිරීම.
  - ❍ වෙළඳ ලැබිය යුතු දෑ සහ ස්ථාවර තැන්පතු ධාරණ අගයේ නිරවද්‍යතාවය තහවුරු කර නොගැනීම.
  - ❍ ණය සහ ලැබිය යුතු දෑ වල හානිකරණයේ යෝග්‍යතාවය පිළිබඳ නිශ්චය කිරීම සඳහා ඒවා කාල විශ්ලේෂණයකට අනුව වර්ග කිරීම පිළිබඳ නිරවද්‍යතාවය, තහවුරු කර නොගැනීම.
  - ❍ දේපළ, පිරියත සහ උපකරණවලට සහ මැණික් තොගවලට කරන ලද එකතු කිරීම්, තහවුරු කර නොගැනීම.
  - ❍ වෙළඳ ගෙවිය යුතු දෑ සහ ඒවායේ ධාරණ අගය නිරවද්‍යතාවය තහවුරු කර නොගැනීම.
  - ❍ මූල්‍ය ගනුදෙනුවක් සිදුකිරීම පිළිබඳව සම්බන්ධිත ජර්නල් සටහන් වලට අදාළව ගණුදෙනු තාර්තිකත්වය තහවුරුකර නොගැනීම.
  - ❍ විකුණුම් ඉන්වොයිස්වල සඳහන් මිල සත්‍යෙක්ෂණය කිරීම මගින් ආදායමේ නිරවද්‍යතාවය සහ පූර්ණත්වය පිළිබඳ තහවුරු කර නොගැනීම.
  - ❍ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ සඳහන් ශේෂය සහ පොදු ලෙජරයේ සඳහන් ශේෂය අතර වෙනස්කමක් පවතින අවස්ථාවලදී සහ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් නොවන ඇතැම් ශේෂයන් බැංකු තහවුරු කිරීම් මගින් පිළිබිඹු කරන අවස්ථාවලදී අදාළ බැංකු ශේෂයන්ගේ පරිපූරණත්වය හා පැවැත්ම පිළිබඳව පරීක්ෂා නොකිරීම.

- තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ ලේඛන ඇගයීම සඳහා විගණනයේ යෙදීසිටින කණ්ඩායම සතු තාක්ෂණික සක්‍යතාවය පිළිබඳ තක්සේරු නොකිරීම සහ තොරතුරු තාක්ෂණ විශේෂඥයින්ගේ සහයෝග යක් නොමැතිව එම ක්‍රමවේදය ඵලදායී බවට නිගමනයකට එළඹීම.
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, දළ ලිඛිත වාරිකයේ ආදායම් සහ විකුණුම් පිරිවැයේ සඳහන් අයිතමවලට අදාළව අන්තර් කාලයට පසුව එළඹුන කාලපරිච්චේදය ආවරණය වන පරිදි විගණන පරිපාටි අනුගමනය නොකිරීම.
- සැලකිය යුතු මට්ටමේ වැරදි ප්‍රකාශන පවතින බවට විගණන සාක්ෂි මගින් පෙන්නුම් කර තිබියදී අතිරේක විගණන ක්‍රියාපටිපාටි අනුගමනය නොකිරීම.
- ඇතැම් ශාඛා සමාගමේ මෙහෙයුම්වල ප්‍රධාන දායකයා බවට පත්වී තිබිය දී එම ශාඛා නිරීක්ෂණය සඳහා යාමට අපොහොසත් වීම.





**5.2 තත්ත්ව පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට සහ පවත්වාගෙන යාමට අපොහොසත් වීම.**

විගණන 10 ක් සම්බන්ධයෙන් විගණන කටයුතුවල නියැලීමේ දී තත්ත්ව පාලන ක්‍රියාමාර්ග අනුගමනය කළ බවට සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

**ඌණතාවයන්ට පහත සඳහන් දෑ ඇතුළත් විය.**

- කිසිදු තත්ත්ව පාලන ක්‍රමවේදයක් ස්ථාපිත නොකිරීම.
- ආයතනය ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගතව පවතිද්දීත් තත්ව පාලන සමාලෝචකයෙකු පත් නොකිරීම.
- විගණනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පාලනය යන කටයුතු වලදී තත්ත්ව පාලන සමාලෝචක ඊට සම්බන්ධ නොවීම.
- විගණන කණ්ඩායම විසින් සිදු කරන ලද සැලකිය යුතු වෙනස්කම් සහ එළැඹි නිගමන පිළිබඳ වාස්තවික ඇගයීමක් තත්ත්ව පාලක සමාලෝචකයා විසින් සිදු නොකිරීම.
- විගණන වාර්තා අත්සන් කළ දිනයට පසු දිනයක දී කාර්ය පත්‍රිකා අත්සන් කිරීම.
- විගණන පරීක්ෂණය සඳහා ඉල්ලුම් කළ දිනය හා විගණන පරීක්ෂණය සිදුකළ දිනය අතර දිනයක දී විද්‍යුත් කාර්ය පත්‍රිකා නවීකරණය කිරීම.
- විගණන කාර්යයේදී ස්වාධීනවීමේ අවශ්‍යතාවය ඉටුකර ඇත්දැයි තහවුරුකර නොගැනීම.

**5.3 පාලනය සම්බන්ධයෙන් වගකීම් පවරන ලද පුද්ගලයින් සමග සම්බන්ධ වී කටයුතු කිරීම පිළිබඳ සාක්ෂි නොමැති වීම.**

පාලනය සම්බන්ධයෙන් වගකීම් පවරන ලද පාර්ශව සමග එනම් විශේෂයෙන් විගණන 9 ක දී විගණන කමිටු සමග සම්බන්ධ වී කටයුතු කළබවට සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි. සැලසුම් කළ විෂය පථයක් සහ විගණන කාලසීමාව පිළිබඳ කරුණු සම්බන්ධයෙන් විගණන කමිටු සමග සම්බන්ධ වී කටයුතු කිරීම පිළිබඳව සාක්ෂි නොමැති වීම පොදු ලක්ෂණයක් වී තිබුණි. එසේම ඇතැම් විගණන පරීක්ෂණවලදී විගණනයේ දී හඳුනාගත් වැදගත් ගැටළු පිළිබඳව පාලනය සම්බන්ධයෙන් වගකීම දරන පාර්ශව දැනුවත් කළ බවට සාක්ෂි නොවීය.

**5.4 ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවල අවධානම අවබෝධ කරගැනීම සහ තක්සේරු කිරීම හා සම්බන්ධ අනුකූල නොවීම්**

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවල අවධානම හඳුනා ගැනීමට හා තක්සේරු කිරීමට අදාළව අනුකූල නොවීම් විගණන 12 ක දී නිරීක්ෂණය විය. තවද හඳුනාගන්නා ලද හා තක්සේරු කරන ලද අවදානම් සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි ප්‍රතිචාර දැක්වීමට විගණන 9 ක දී අපොහොසත් වී තිබුණි.

**නිරීක්ෂණය වු ඌණතාවයන්ට පහත සඳහන් දෑ ඇතුළත් විය.**

- ආයතනය සහ එහි අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට අපොහොසත් වීම සහ පාලන රටාවන් සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ තක්සේරු නොකිරීම.
- වඩා අවධානය යොමු කරන ලද පුළුල් විගණන ක්‍රියාපටිපාටියක් යොදාගනු පිණිස සැලකිය යුතු අවධානම් හඳුනාගැනීමට අපොහොසත් වීම.
- මූල්‍ය වර්ෂය තුළ දී තොරතුරු තාක්ෂණ පද්ධතියට සිදුකරන ලද වෙනස්කම් ඇගයීම් නොකිරීම.

**5.5 විගණන නියැදි තෝරාගැනීමේ ඌණතා**

විගණන නියැදි තෝරාගැනීම්වලට අදාළව අනුකූල නොවීම් විගණන 20 ක දී නිරීක්ෂණය විය.

එම නිරීක්ෂණයන්ට පහත සඳහන් දෑ ඇතුළත් විය.

- විගණන ක්‍රියාපටිපාටියේ අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි රැස් කර ගැනීම පිණිස පරීක්ෂා කිරීම සඳහා නියැදි තෝරාගැනීමේ පදනම තහවුරු කිරීමට අපොහොසත් වීම.
- සමූහයේ සෑම නියැදි ඒකකයකටම තෝරාගනු ලැබීම සඳහා අවස්ථාව ලබා දෙමින් නියැදියක අයිතම තෝරා ගැනීමට අපොහොසත් වීම.
- තෝරාගත් නියැදියේ සෑම අයිතමයක් සම්බන්ධයෙන්ම උචිත විගණන ක්‍රියාපටිපාටි අනුගමනය කිරීමට අපොහොසත් වීම.
- සමූහය පිළිබඳව නිගමනයකට එළඹීමේ දී නියැදි භාවිතය ඒ සඳහා සාධාරණ පදනමක් සැපයූවාදැයි යන්න නිශ්චය කිරීම සඳහා නියැදි ප්‍රතිඵල ඇගයීමට අපොහොසත් වීම.

**5.6 සාධාරණ අගය මත වන ගිණුම් ඇස්තමේන්තු ද ඇතුළත් ගිණුම් ඇස්තමේන්තු සහ අදාළ හෙළිදරව් කිරීම්.**

කළමනාකරණ විසින් ගිණුම් ඇස්තමේන්තු සහ එම ඇස්තමේන්තු සඳහා පදනම් වුන යෙදවුම් දත්ත භාවිතා කළ ආකාරය පිළිබඳ පරීක්ෂාකිරීමට අපොහොසත්වීම් විගණන 13 ක දී නිරීක්ෂණය විය.

**ඌණතාවයන්ට පහත සහන් දෑ ඇතුළත් විය.**

- හානිකරණ පරීක්ෂණ ආදර්ශයේදී සලකා බැලූ ස්කන්ද පිරිවැය ගණනය කිරීමේදී භාවිතා කළ යෙදවුම් ලබාගැනීම සඳහා භාවිතා කළ මූලාශ්‍ර ස්වාධීනව පරීක්ෂා කිරීමට අපොහොසත් වීම.
- දේපළවල සාධාරණ අගය නිශ්චය කිරීමේ දී කළමනාකරණය විසින් කරනු ලැබූ වැදගත් උපකල්පනවල සාධාරණත්වය පිළිබඳ ඇගයීමට අපොහොසත් වීම.

**5.7 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමක දී වංචාවලට අදාළව විගණකවරයා සතු වගකීම්.**

වංචාවන් හේතුකොටගෙන මූල්‍ය ප්‍රකාශනවල සිදුවී ඇති ප්‍රමාණවත් සාවද්‍ය ප්‍රකාශවල අවධානම හඳුනා ගැනීමට සහ තක්සේරු කිරීමට විගණන 22 ක දී විගණකවරයා අපොහොසත් වී තිබුණි.

**නිරීක්ෂණවලට පහත සඳහන් කරුණු ඇතුළත් විය**

- ජර්නල් සටහන්වලට අදාළව විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී දක්නට ලැබුණු ඌනතා.

**උදාහරණ:**

  - වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ දී ජර්නල් සටහන් පරීක්ෂා නොකිරීම.
  - සාවද්‍ය ජර්නල් සටහන්වල ලක්ෂණ පදනම් කරගෙන ජර්නල් සටහන්වල නියැදි තෝරා ගැනීමට අපොහොසත් වීම.

- ජර්නල් සටහන් කිහිපයක් පරීක්ෂා කිරීම හැර පාලනය සම්බන්ධයෙන් කළමනාකරණයේ දැඩි බලපෑමට අදාළව පවතින අවධානම හඳුනාගැනීම සඳහා විගණන ක්‍රියාපටිපාටි අනුගමනය කිරීමට අපොහොසත් වීම.

**5.8 අනෙකුත් නිරීක්ෂණ**

- සමූහ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේ දී සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා ඒකාබද්ධකරණයට අදාළ ගැලපුම්, සංරචක පිළිබඳ මූල්‍ය තොරතුරු සහ ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ කිසිදු විගණන සාක්ෂියක් ලබාගැනීමට විගණකවරයා අපොහොසත් වී තිබුණි.





- විගණන ලේඛන ඇතුළත් ඇතැම් ලිපිගොනු පරීක්ෂා කිරීමේ දී අවධානම් ඇතිවිය හැකි ක්ෂේත්‍ර හඳුනාගැනීමට සහ මූල්‍ය ප්‍රකාශනවල කේවල සංරචක විගණනය කිරීමේ දී එළඹී නිගමන තහවුරු කිරීමට සැලසුම් කරන අවධියේ දී විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි අනුගමනය කළ බවට ප්‍රමාණවත් සාක්ෂි නොතිබුන අතර සමස්ත විගණන ක්‍රමෝපාය සහ විගණන සැලසුම පිළිබඳ කිසිදු ලේඛනගත කිරීමක් නොතිබුණි.
- ඇතැම් විගණනවලදී බාහිර තහවුරු කිරීම් ක්‍රියාපටිපාටි මගින් අදාළ සහ විශ්වාසනීය විගණන සාක්ෂි ලබා දී ඇත්ද යන්න හෝ තවදුරටත් විගණන සාක්ෂි ලබාගැනීමට අවශ්‍යවන්නේද යන්න හෝ පිළිබඳ තක්සේරු කිරීමට විගණකවරයා අපොහොසත් වී තිබිණි.
- සම්බන්ධිත පාර්ශව සම්බන්ධතා සහ ගනුදෙනු නිසියාකාරව හඳුනාගෙන ගිණුම්ගත කර තිබේ ද සහ හෝ ගිණුම් ප්‍රකාශනවල හෙළිදරව් කර තිබේද යන්න පිළිබඳ ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ඇතැම් විගණකවරුන් ලබාගෙන නොතිබිණි.

## 6. අනාගත පරීක්ෂා කිරීම් වලදී අවධානය යොමුකරන කරුණු

**6.1** ගෝලීය මතයට අනුව යමින් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විගණනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගෙන ඇත. මෙම අවශ්‍යතාවය ඉටුකිරීමට මුලපුරනු වස් විගණන පරීක්ෂණ කාර්යයේ නියැලී සිටින කාර්යමණ්ඩලයට එක්සත් රාජධානියේ නියාමන කාර්යය පිළිබඳ පුළුල් අත්දැකීම් සහ විශේෂඥ දැනුම ඇති උපදේශකයින් දෙදෙනෙක් මගින් පරිපූර්ණ පුහුණුවක් ලබා දෙන ලදී. ධාරිතා වර්ධන ක්‍රියාවලියෙන් පසු පරීක්ෂණ සඳහා සවිස්තරාත්මක සැලැස්මක් සහ දැඩි පරීක්ෂා කිරීම්වලින් සමන්විත අවධානම් පාදක ප්‍රවේශයක් කරා යොමුවීම කෙරෙහි ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ අවධානය යොමු වී ඇත. මෙම ඉලක්කය තවදුරටත් වර්ධනය කරමින් 2017 වර්ෂයේ දී මෙම ක්‍රියාවලිය ප්‍රයෝගික වශයෙන් යෙදවීම සම්බන්ධයෙන් විගණන ආයතනවලට අවබෝධයක් ලැබෙන පරිදි සාකච්ඡා පැවැත් වීමටත් හඳුනාගත් තේමා සම්බන්ධයෙන් තේමාගත පරීක්ෂණ සිදුකිරීමටත් ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය අපේක්ෂා කරයි. විගණකවරුන්ට විශේෂයෙන් අවධානය යොමුකළ ක්ෂේත්‍රයට අදාළව සිදුකරනු ලබන විගණනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා තේමාගත පරීක්ෂණ ඉවහල් වනු ඇත. තවද 2017 වර්ෂයේදී ආයතනික ගුණාත්මක පරීක්ෂණ ආරම්භ කිරීමට ද ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය අපේක්ෂා කරයි. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ පනත සංශෝධනය කරමින් පවතින නිසා ස්වෙච්ඡාවෙන් පරීක්ෂාවට ලක්වීමට ඉදිරිපත්වන ආයතනය පිළිබඳ ආයතනික ගුණාත්මක පරීක්ෂණ පැවැත්වීමට ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය සැලසුම් කර ඇත.

**6.2** මූල්‍ය වාර්තාකරණ සැලසුම් දාමයේ දී සහභාගිවන්නන්ගෙන් සහාය ලැබෙන සහ සහභාගීවන්නන් අතර යෝග්‍ය අන්තර් ක්‍රියාකාරකම් සිදුවන පරිසරයක විගණනයේ ගුණාත්මකභාවය මැනවින් ලබාගැනීමට හැකි වන නිසා විගණනයේ ගුණාත්මක සාධක සම්බන්ධයෙන් වන විගණන පරිසරය පිළිබඳ සහභාගිවන්නන් තුල දැනුවත් භාවයක් ඇතිකිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය හඳුනාගෙන ඇත. ආරම්භක පියවරක් වශයෙන් 2018 වර්ෂයේ සිට බලපැවැත්වීමට නියමිත නව විගණන වාර්තා පිළිබඳ සහ ජාත්‍යන්තර විගණන සහ තහවුරු ප්‍රමිති මණ්ඩලය විසින් සම්පාදනය කරන ලද විගණන ගුණාත්මකභාවය සඳහා වන කාර්යරාමුව පිළිබඳ වෙන වෙනම වැඩමුළු නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්හි විගණන කාර්යයන් සිදු කිරීම සම්බන්ධයෙන් සෘජුවම සම්බන්ධ වන මූල්‍ය කෙෂ්ත්‍රයේ නියාමකයින්, විගණකවරුන් සහ විගණන කමිටු සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් පවත්වන ලදී.

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය එහි වාර්ෂික කාර්ය සාධන සැලසුම් සකස්කිරීම පිණිස කාර්ය සාධන ලකුණු පත යොදා ගනී. 2016 සැලැස්ම, 2016 තත්‍ය සටහන හා 2017 දී සැලැස්ම පහත දක්වා ඇත.

**මූල්‍ය ප්‍රකාශන පරිශීලක දෘෂ්ටිකෝණය**

අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන් අපව දැකිය යුත්තේ කෙසේද?

| ඉලක්කය | ක්‍රියා මාර්ග | 2016 සැලැස්ම | 2016 තථ්‍ය සටහන | | 2017 සැලැස්ම |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | සැලැස්මේ ප්‍රතිශතයක් ලෙස | |
| නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල මූල්‍ය ප්‍රකාශනවලින් සත්‍ය හා සාධාරණ නිරූපණයක් පිළිබිඹු කිරීම | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවී තිබේදැයි යන්න නිශ්චය කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම | මූල්‍ය ප්‍රකාශන කට්ටල 720 | මූල්‍ය ප්‍රකාශන කට්ටල 731 | 102 | මූල්‍ය ප්‍රකාශන කට්ටල 720 (සටහන 1) |
| | ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලවී තිබේදැයි යන්න නිශ්චය කිරීම සඳහා විගණන පරීක්ෂා කිරීම | විගණන 100 | විගණන 99 | 99 | විගණන 100 (සටහන 2) |

**නියාමනයට භාජනය වූ ආයතන දෘෂ්ටිකෝණය**

අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා නියාමනයට භාජනය වූ ආයතන අපව දැකිය යුත්තේ කෙසේද?

| ඉලක්කය | ක්‍රියා මාර්ග | 2016 සැලැස්ම | 2016 තථ්‍ය සටහන | | 2017 සැලැස්ම |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | සැලැස්මේ ප්‍රතිශතයක් ලෙස | |
| මූල්‍ය ප්‍රකාශන එක්රැස් කිරීම | ලැබුණු මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 1,410 | 1,536 (සටහන 3) නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය සංඛ්‍යාව 1,412 | 109 | 1,485 |





**අභ්‍යන්තර ක්‍රියාවලි දෘෂ්ටිකෝණය**

අප පාර්ශවකරුවන් තෘප්තිමත් කිරීම සඳහා අප කුමන අභ්‍යන්තර ක්‍රියාවලියක් සම්බන්ධයෙන් විශිෂ්ටත්වයක් දැක්විය යුතුද?

| ඉලක්කය | ක්‍රියා මාර්ග | 2016 සැලැස්ම | 2016 තථ්‍ය සටහන | | 2017 සැලැස්ම |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | සැලැස්මේ ප්‍රතිශතයක් ලෙස | |
| සේවක කාර්ය සාධනය | වර්ෂය සඳහා ඉලක්කගත කාර්ය සාධන ලකුණු ළඟාකර ගැනීම (සටහන 4) | 35,868 | 30,739 (සටහන 05) | 86 | 29,484 |
| දැනුම වර්ධනය කරගනිමින් වර්තමාන මෙහෙවර ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ඇති බාධක ඉවත් කිරීම | සතිපතා කෙරෙන ඉගෙනුම් ක්‍රියාකාරකම් (අභ්‍යන්තර) | ප්‍රමිති පිළිබඳ දේශන 48 | ප්‍රමිති පිළිබඳ දේශන 13 (පැය 15)<br>ගිණුම්කරණය, විගණනය සහ නියාමනය යන අංශ පිළිබඳ දින 24 ක පුහුණුව (පැය 168) (සටහන 6) | 27 | 48 |
| කාලානුරූප ප්‍රතිචාර | ලැබුණු පැමිණිලි, ඉල්ලීම් කරන ලද පැහැදිලි කිරීම් සහ ලැබුණු තොරතුරු පිළිබඳව කටයුතු කිරීම | ලැබුනු දිනය හා ප්‍රතිචාර දැක්වූ දිනය හැර සාමාන්‍ය වශයෙන් දින 5ක් ඇතුලත | ලැබුනු දිනය හා ප්‍රතිචාර දැක්වූ දිනය හැර දින 1.6 | | ලැබුනු දිනය හා ප්‍රතිචාර දැක්වූ දිනය හැර සාමාන්‍ය වශයෙන් දින 5ක් ඇතුලත |

**සටහන 1**
මූල්‍ය ප්‍රතිඵල සමාලෝචනයේ ඵලදායීතාවය වර්ධනය කරනු පිණිස කර්මාන්ත අනුව වන සුවිශේෂීතාවය කෙරෙහි අවධානය යොමු කර සමාලෝචන සිදු කිරීමට නියමිතය.

**සටහන 2**
ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය ශක්තිමත් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා 2016 පරිපූරක අයවැය ප්‍රතිපාදන යටතේ තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා පැවැත්වූ ධාරිතා වර්ධන වැඩසටහනින් පසු 2017 වර්ෂයේදී පවත්වනු ලබන පරීක්ෂණ වඩා ගැඹුරු ප්‍රවේශයකින් යුක්තව තේමාගත හා ආයතනගත පරීක්ෂණ ලෙස පැවැත්වීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

**සටහන 3**
පසු විපරම් සිදු කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුකොටගෙන පෙර වර්ෂය සඳහා නිකුත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ලැබීම.

**සටහන 4**
කටයුත්ත සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය කාර්යයයේ ස්වභාවය සහ ප්‍රමාණය මත කාර්ය සාධන ලකුණු පදනම් වේ.

**සටහන 5**
සමාලෝචන කාර්යය සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් දෙදෙනාගේ සම්බන්ධවීම වඩා උපාය සම්බන්ධී මට්ටමක පැවති හෙයින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් දෙදෙනාගේ කාර්යසාධන ලකුණු බැහැර කර ඇත.

**සටහන 6**
ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය ශක්තිමත් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා 2016 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් යටතේ බාහිර සම්පත් දායකයින් විසින් පවත්වන ලද අභ්‍යන්තර පුහුණු සැසි සංඛ්‍යාව හේතුකොටගෙන අභ්‍යන්තර දේශන සංඛ්‍යාව අඩු කරන ලදි. සංකීර්ණ ගිණුම් ගැටලු තේමාගත සහ ආයතනික පරීක්ෂණ පිළිබඳ විගණන ප්‍රවේශ, විගණකවරුන් සඳහා වාර්තාකරණය, නව විගණන වාර්තා, ආචාරධර්ම සහ ප්‍රාථමික වෙළඳ මෙහෙයුම් පිළිබඳ ජාත්‍යන්තර සහ දේශීය සම්පත් දායකයින් විසින් සෑම තාක්ෂණික කාර්ය මණ්ඩල සාමාජිකයකු සඳහාම දින 24 ක පුහුණුවක් ලබාදෙන ලදි.

විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීආර්ටී/සී/එස්එල්ඒඒඑස්එම්බී/එෆ්එස්/2016
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2017 අගෝස්තු 29 දින

සභාපති

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය.

**ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත පනතේ 33 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2017 ජූනි 27 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk





**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ඡේදය ප්‍රකාරව, සකස් කර තිබූ කාර්ය පරිපාටි අත්පොත සඳහා මණ්ඩලය විසින් 2017 ජූලි 31 දින වන විටත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, මණ්ඩලයේ ප්‍රධාන ආදායම වන රජයේ ප්‍රදාන පෙර වර්ෂයට සාපේක්ෂව රු. 24,891,648 කින් එනම් සියයට 35 කින් සහ පුනරාවර්තන වියදම රු. 24,891,648 කින් එනම් සියයට 36 කින් වැඩි වී තිබුණි. විශේෂ ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා ලැබී තිබූ රු. 21,679,041 ක් වූ ප්‍රතිපාදන හා ඒ මඟින් කළ පුනරාවර්තන වියදම මෙම වැඩිවීම්වලට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල සැසඳීමේදී සෑම වර්ෂයක් සඳහාම මණ්ඩලයේ අතිරික්තයක් හෝ ඌනතාවයක් නොතිබුණද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සැලකීමේදී මණ්ඩලය විසින් 2012 වර්ෂයේදී රු.18,926,728 ක දායකත්වයක් ලබා දී තිබුණි. පසු වර්ෂවලදී දායකත්වය අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර 2016 වර්ෂයේදී රු. 48,869,249 ක් වී තිබුණි.





**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්යසාධනය**

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත අනුව, මණ්ඩලයේ කර්තව්‍ය වන්නේ, නිශ්චිත ව්‍යාපාර ආයතන මඟින් ශ්‍රී ලංකා ගිණුම් හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට එකඟව ක්‍රියාකරන බවට අධීක්ෂණය කිරීමයි.

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව නිශ්චිත ව්‍යාපාර ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන සමීක්ෂණයේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දිවයිනේ පවතින නිශ්චිත ව්‍යාපාර ආයතන ප්‍රමාණය මණ්ඩලය විසින් 2017 ජූනි 30 දින වන විටත් නිවැරදිව හඳුනා ගෙන නොමැති බව හා ඒ සඳහා සුදුසු යාන්ත්‍රණයක්ද (Mechanism) හඳුනාගෙන ක්‍රියාත්මක කර නොමැති බව විගණනයේදී අනාවරණය විය.

(ආ) 2015 හා 2016 වර්ෂවල පිළිවෙලින් මූල්‍ය ප්‍රකාශන 1,527 ක් හා 1,681 ක් ලැබී තිබුණද, එම වර්ෂවලදී සමීක්ෂණය කර තිබූ මූල්‍ය වාර්තා ප්‍රමාණය පිළිවෙලින් 1,122 ක් හා 731 ක් පමණක් විය. එම නිසා වර්ෂය තුළ ලද සියළුම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමීක්ෂණයක්, මණ්ඩලය විසින් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. 2016 වර්ෂය තුළදී මණ්ඩලය වෙත ලද මූල්‍ය ප්‍රකාශන 1,681 තුළ දෙවන වරට ලද පිටපත් (Duplicate), නිශ්චිත ව්‍යාපාර නොවන ආයතනවල හා පෙර වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිවෙලින් 66, 79 හා 124 ක් වීම හේතුවෙන් 2015 වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂයේදී ලද මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව 1,412 ක් පමණක් විය. මේ අනුව මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන සමීක්ෂණ කටයුතු කාර්යක්ෂමව සිදු කරන බවක් විගණනයේදී නිරීක්ෂණය නොවිය.

(ඇ) මණ්ඩලය විසින් පෙර පැවති අහඹු ක්‍රමයට ගිණුම් වාර්තා පරීක්ෂා කිරීමේ ක්‍රමය වෙනුවට සියළුම ආයතනවල ගිණුම් වාර්තා පරීක්ෂා කිරීමේ ක්‍රමයක් ඇති කොට ඒ වෙනුවෙන් මණ්ඩලයේ තාක්ෂණික කළමනාකරුවන් දක්වා වූ නිලධාරීන්ට, රු.65,000 ක මාසික දිරි දීමනාවක් ලෙස සමාලෝචිත වර්ෂය තුළ රු. 11,921,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද ලද මූල්‍ය ප්‍රකාශන වලින් සියයට 65 ක් පමණ අහඹු ක්‍රමයට තෝරා ගෙන වර්ෂ 3 කට හා 5 කට වරක් සමීක්ෂණය කිරීමට මණ්ඩලය ක්‍රියා කර තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන සමීක්ෂණයේදී ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති වලට අනුකූලව ඒවා පිළියෙල කර ඇති බවට තහවුරු කර ගැනීමට ක්‍රමවත් මාර්ගෝපදේශ (Manual/ Guideline)/ පරීක්ෂණ ලැයිස්තු (Check list) / උපදෙස් පත්‍රිකා, අභ්‍යන්තර හා බාහිර සමීක්ෂකයින් වෙත හඳුන්වා දී නොමැති බව නිරීක්ෂණය විය. මේ නිසා මණ්ඩලයේ සමීක්ෂණයට ලක්වන, ඇතැම් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිතිවලට අනුකූල වන බව හෝ අනුකූල නොවන බව දක්වමින් අදාල ආයතනයන් වෙත කිසිදු ආකාරයේ අනාවරණයක් නොකිරීම හේතුවෙන් එම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා විගණනයේ අනුකූලතාවයන් පිළිබඳව විගණනයේදී ගැටළුකාරී විය.

(ඉ) මූල්‍ය ප්‍රකාශන සමීක්ෂණය කිරීම වෙනුවෙන් බාහිර සමීක්ෂකයින් වෙත දින 30 ක කාලයක් ලබාදී ඇති නමුත් සමීක්ෂණය අවසන් කර නැවත බාරදීමේදී එම කාලය ඉක්මවා දින 03 සිට දින 32 දක්වා ප්‍රමාදයන් නිරීක්ෂණය විය. එසේම ලබාදුන් මූල්‍ය ප්‍රකාශන සමීක්ෂණය කිරීමකින් තොරව මණ්ඩලය වෙත ආපසු බාරදුන් අවස්ථා ද විය. කෙසේ වුවද, ඉදිරියේදී මෙම ප්‍රමාදයන් සඳහා දඩ මුදලක් ලෙස ගාස්තුවෙන් යම් ප්‍රතිශතයක් අය කිරීමට යෝජනා කර ඇති බව මණ්ඩලය විසින් විගණනයට දන්වා තිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන සමීක්ෂණයේ ප්‍රගතිය (පසු විපරම් ඇතුළුව) පරීක්ෂා කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන ඇතුලත් සමීක්ෂණ ලිපිගොනු පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි, මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන සමීක්ෂණ අනාවරණයන් සඳහා අදාල ආයතනයන් වලින් ප්‍රතිචාර නොලැබුණු අවස්ථා, වර්ෂ කිහිපයකම එක සමාන අනාවරණයන් අදාල ආයතන වෙත යවා ඇති අවස්ථා හා ඒවා නිවැරදි වූ බවට ප්‍රතිචාර නොලැබෙන බව සහ තාක්ෂණික ගැටළු සහ තොරතුරු ලබා ගැනීමේ ප්‍රමාදයන් වැනි හේතු මත සමීක්ෂණ කටයුතු අවසන් නොවූ අවස්ථා පැවතුණි.

(උ) 2016 වර්ෂයේදී ලද මූල්‍ය ප්‍රකාශන තුළ පෙර වසර කිහිපයකට අදාල මූල්‍ය ප්‍රකාශන ද තිබුණු අතර එසේ වර්ෂ ගණනාවක් ගතවී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සම්බන්ධව පසුවිපරම් කළ බව හෝ කාලීනව කටයුතු නොකළ ආයතනයන්ට එරෙහිව පනත ප්‍රකාරව, ඉදිරි පියවර ගෙන නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය, තාක්ෂණික හා මූල්‍ය සම්පත් මගින් ශක්තිමත් කිරීමටත් ආයතනයේ කාර්යභාරය සහ විෂය පථය පුළුල් කිරීම සඳහාත් අදාල පනත සමාලෝචනය කිරීම හා තොරතුරු පද්ධතියක් හඳුන්වාදීමට අයවැය



විගණකාධිපති වාර්තාව



විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

යෝජනා මගින් සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 100 ක අයවැය ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එහෙත් දැනට පවතින පනත ඇති කර මේ වන විට වර්ෂ 20 කට අධික කාලයක් ගත වී තිබුණද, ඊට අදාල නිර්දේශිත සංශෝධනයන් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළද සංශෝධිත පනත 2017 ජූලි 31 දින වනවිටත් අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කර නොතිබුණු අතර සමාලෝචනයේදී හඳුනාගත් තොරතුරු, වාර්තා කිරීමේ නව තොරතුරු පද්ධතියක් හඳුන්වාදීමද සිදුකර නොතිබුණි.

(එ) 2012 සැප්තැම්බර් 19 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාවේ 11 වන නියෝගය අනුව, මණ්ඩලය පිළිබඳ සමාජයේ දැනුවත්වීම ප්‍රමාණවත් නොවන නිසා සමාජීය දැනුවත් කිරීම (Social Awareness) සඳහා ක්‍රියා කළ යුතු බව නියෝග කර තිබුණද 2017 ජූනි 30 වනවිටත් ඒ සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

## 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත සංශෝධනයට අදාලව රාජ්‍ය අංශය අධීක්ෂණය සඳහා (Monitor) මානව සම්පත ලබා ගැනීමේ අවශ්‍යතාවය සහ ඒ සඳහා කාර්යාල ඉඩ පහසුකම්ද ලබා ගත යුතු බව හඳුනාගෙන තිබුණි. එහෙත් පනත සංශෝධනය කර නොතිබියදී එහි සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීමක් ලෙස බාහිර පාර්ශවයන් හා මණ්ඩලය අතර ඇති කර ගත් 2016 දෙසැම්බර් 16 දිනැති හා අංක 1079 දරන ගොඩනැගිලි බදු ගිවිසුම අනුව මෙ සඳහා ආපසු ගෙවන ආරක්ෂක තැන්පතුවක් ලෙස මාස 6 ක කුලී මුදලකට සමාන වටිනාකමක් එනම් රු. 1,740,960 ක් 2016 දෙසැම්බර් 20 දින ගෙවා තිබුණද එම මහල 2017 ජූනි 30 දක්වා ඉහත සඳහන් කාර්යයන්ට යොදා ගෙන නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු 03ක්, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් හා තෘතීයික මට්ටමේ තනතුරු 02 ක් සඳහා 2009 වර්ෂයේ සිට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සිදුකර තිබූ අතර ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු 03 සඳහා නිත්‍ය තනතුරුවලට අනුමත පාරිශ්‍රමිකවලට වඩා ඉහල ප්‍රතිලාභ, එම තනතුරු දරන්නන් සඳහා ගෙවනු ලබන බවත් නිරීක්ෂණය විය.

7

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 2 ක් සඳහා 2017 ජුනි 30 දින වනවිටත් පිළිවෙලින් වර්ෂයක් හා මාස 3 කට වරක් බැගින් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරමින් තනතුරු පවත්වාගෙන තිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 ඡේදය ප්‍රකාරව, විශේෂයෙන්ම කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු පිරවීම සම්බන්ධව සෑම ආයතනයකම අනුප්‍රාප්තික සැලසුමක් තිබිය යුතු වුවද මණ්ඩලය විසින් එසේ සැලසුම්ගතව ක්‍රියා කර නොතිබුණි.

(ඈ) එසේම ඉහත "ඇ" හි සඳහන් චක්‍රලේඛයේ 9.7 ඡේදය ප්‍රකාරව, සෑම ආයතනයක්ම වැටුප් හා දීමනා ගෙවීම අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් මත සිදු කළ යුතු වුවද, මණ්ඩලය විසින් තනතුරු 03 ක් සඳහා එසේ ක්‍රියා කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තථ්‍ය වියදම් අයිතම්වල සියයට 11 සිට 117 දක්වා පරාසයක විචලනයන් පැවතීමෙන් මූල්‍ය පාලන උපක්‍රමයක් ලෙස අයවැය ලේඛනය යොදා ගැනීමේ දුර්වලතාවයක් පැවති බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රවල අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන සමීක්ෂණය | විධිමත් මාර්ගෝපදේශ සහිතව හා කාලීනව මූල්‍ය ප්‍රකාශන සමීක්ෂණය නොකිරීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවා ගැනීමේ පරිපාටි හා තනතුරු පුරප්පාඩු පිරවීම විධිමත් නොවීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

| දිනට | සටහන | 2016 දෙසැ. 31 රු. | 2015 දෙසැ. 31 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 3 | 30,435,576 | 30,874,340 |
| තැන්පතු | 4 | 6,879,736 | 5,138,775 |
| ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ වත්කම් | 9 | | 259,859 |
| | | 37,315,312 | 36,272,974 |
| **ජංගම වත්කම්** | | | |
| තොග ලේඛණ | 5 | 576,865 | 521,125 |
| අයවිය යුතු දෑ | 6 | 3,177,666 | 1,869,420 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 7 | 2,110,767 | 1,492,926 |
| | | 5,865,297 | 3,883,471 |
| **මුළු වත්කම්** | | 43,180,609 | 40,156,445 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්බිත ආදායම් රාජ්‍ය ප්‍රදාන | 8 | 37,208,854 | 36,272,974 |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් | 9 | 106,458 | |
| | | 37,315,312 | 36,272,974 |
| **ජංගම වගකීම්** | | | |
| විලම්බිත ආදායම් රාජ්‍ය ප්‍රදාන | 10 | 2,290,471 | 923,935 |
| ගෙවිය යුතු දෑ | 11 | 3,574,826 | 2,959,536 |
| | | 5,865,297 | 3,883,471 |
| **මුළු වගකීම්** | | 43,180,609 | 40,156,445 |

51 වන පිටුවේ සිට 57 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍යම කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වගකිවයුතුවේ.

මෙම මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය විසින් අනුමතකර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා ඇත..

සභාපති

සාමාජික

අධ්‍යක්ෂ ජනරාල්
2017 ජූලි 11 දින

මූල්‍ය හා පරිපාලන කළමනාකරු

# මූල්‍ය කාර්යසාධනය හා අනෙකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | **2016 දෙසැ. 31 රු.** | 2015 දෙසැ. 31 රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| රාජ්‍ය ප්‍රදාන | 12 | 96,550,511 | 71,658,863 |
| අඩුකලා: ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට ලබාදුන් රාජ්‍ය ප්‍රදාන | | 2,500,000 | 2,500,000 |
| | | 94,050,511 | 69,158,863 |
| **මෙහෙයුම් වියදම්** | | | |
| මණ්ඩල සාමාජික දීමනා | | (1,552,500) | (745,333) |
| විගණකවරුන්ගේ පාරිශ්‍රමික | 13 | (163,180) | (196,242) |
| කාර්ය මණ්ඩල පිරිවැය | 14 | (39,350,133) | (37,322,152) |
| ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය | | (1,547,910) | (1,423,720) |
| පුවත්පත් නිවේදන | | (718,034) | (740,650) |
| කුලී හා ගොඩනැගිලි සේවා ගාස්තු | | (6,234,891) | (6,121,671) |
| ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් | 3 | (9,519,116) | (9,835,358) |
| විදුලි වියදම් | | (1,457,899) | (1,363,186) |
| සමාලෝචකයින් සඳහා වූ වෘත්තීය ගාස්තු | | (940,000) | (1,130,000) |
| අන්තර්ජාතික සාමාජිකත්වයන් | | (1,596,780) | (1,113,833) |
| පොත් හා වාර සඟරා | | (897,565) | (1,078,530) |
| ජාත්‍යන්තර ගමන් | | (2,503,394) | (3,024,736) |
| පුහුණුව හා සංවර්ධනය | | (799,130) | (847,805) |
| බලපත්‍ර හා රක්ෂණ | | (822,572) | (734,539) |
| ලිපි ද්‍රව්‍ය | | (790,041) | (636,657) |
| විශේෂ ධාරිතා වර්ධන වියදම් | 15 | (21,679,041) | |
| වෙනත් පරිපාලන වියදම් | 16 | (3,478,325) | (2,844,451) |
| **වෙනත් විස්තීර්ණ අදායම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් යලි ගණනය කිරීමෙන් ලාභය / (පාඩුව) | | 333,157 | 1,335,222 |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් යලි ගණනය කිරීමට අදාල රජයේ ප්‍රදාන | | (333,157) | (1,335,222) |
| | | | |
| **වර්ෂයේ ශුද්ධ අතිරික්ත/(හිඟය)** | | | |

51 වන පිටුවේ සිට 57 වන පිටුව දක්වා සඳහන් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍යම කොට සකි.



# ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

| | සමුච්චිත අරමුදල රු. |
|---|---|
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය) | - |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය) | - |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - |

51 වන පිටුවේ සිට 57 වන පිටුව දක්වා සඳහන් මූල්‍ය ප්‍රකාශනවලට සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍යම කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා* | සටහන | **2016 දෙසැ. 31 රු.** | 2015 දෙසැ. 31 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය) | | | |
| ගැලපීම්; | | | |
| වර්ෂය තුල ලද රාජ්‍ය ප්‍රදාන | | 98,519,770 | 67,317,275 |
| මුළු විස්තීර්ණ ආදායම්වලට මාරුකල විලම්භිත රාජ්‍ය ප්‍රදාන | 12 | (96,217,354) | (70,323,641) |
| ජංගම නොවන වත්කම් ලෙස ලැබූ ප්‍රදානයන් | 3 | (7,390,000) | |
| ක්ෂය වීම් | 3 | 9,519,116 | 9,835,358 |
| කාර්යාල උපකරණ ඉවත්කිරීමේදී වූ අලාභය | | 7 | 1 |
| පාරිතෝෂික අරමුදලේ ආයෝජනයෙන් ලද පොළිය | | (358,981) | (93,172) |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් | 14.1 | 418,240 | (549,338) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර වියදමට වැඩි | | | |
| අතිරික්ත ආදායම / (ආදායමට වැඩි වියදම) | | 4,490,798 | 6,186,483 |
| කුලී තැන්පතු (වැඩිවීම් / අඩුවීම්) | | (1,740,960) | |
| තොග (වැඩිවීම)/අඩුවීම | | (55,740) | 60,485 |
| ලැබිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම | | (1,308,246) | (233,887) |
| ගෙවිය යුතු මුදල් වැඩිවීම/(අඩුවීම) | | 615,291 | (1,495,113) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 2,001,143 | 4,517,968 |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම් | | (1,690,360) | (1,359,685) |
| පාරිතෝෂික අරමුදලේ ආයෝජනය | | | (2,700,000) |
| පාරිතෝෂික අරමුදලේ ආයෝජනයෙන් ලද පොළිය | | 307,058 | 110,689 |
| ශුද්ධ මුදල් ප්‍රවාහය | | 617,841 | 568,972 |
| | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | 617,841 | 568,972 |
| වසර ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ | | 1,492,926 | 923,954 |
| වසර අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | 7 | 2,110,767 | 1,492,926 |

51 වන පිටුවේ සිට 57 වන පිටුව දක්වා සඳහන් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍යම කොටසකි.





# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

## 1. සංස්ථාපිත තොරතුරු

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2017 ජූලි 11 වන දින පැවති රැස්වීමේ දී සාමාජිකයින්ගේ එකඟතාවය මත අනුමත කරන ලදී. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත මගින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ විධිවිධාන ප්‍රකාරව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්ගේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම හා විගණනය කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති හා විගණන ප්‍රමිතිවලට අනුකූලවීම අධීක්ෂණය කිරීම මණ්ඩලයේ කාර්යභාරය වේ. 2016 දෙසැම්බර් 31 දිනට ස්ථිර පදනම මත සේවකයින් 15 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 6 දෙනෙකු මණ්ඩලය විසින් සේවයේ යොදවා තිබිණි. (2015 දෙසැම්බර් 31 දිනට ස්ථිර සේවකයින් 15 ක් සහ කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 5 ක් විය.)

## 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

**මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ පදනම**

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, ඓතිහාසික පිරිවැය හා උපචිත පදනම මත රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති වලට අනුකූලව සකස් කෙරේ.

මූල්‍ය ප්‍රකාශන, දිගුකාලීන පැවැත්ම පදනම් කරගෙන පිළියෙල කරන අතර එය වසර පුරාම නියතව පවත්වාගෙන යනු ලැබේ.

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයෙන් පසු සිදු වූ සිද්ධීන්**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයෙන් පසු සිදු වූ සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් පිළිබඳව අදාළභාවය අනුව අවශ්‍ය ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනයන්ට ඇතුළත් කෙරේ.

**දේපළ, පිරියත හා උපකරණ**

දේපළ, පිරියත හා උපකරණ, ඒවායේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කල අගයට දක්වනු ලැබේ. වත්කම්වල තක්සේරු කරන ලද ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය සඳහා ප්‍රතිපාදනය කෙරේ.

| **විස්තර** | **තක්සේරු කරන ලද ජීවිත කාලය** |
|---|---|
| මෝටර් වාහන | වර්ෂ 5 |
| කාර්යාල උපකරණ | වර්ෂ 4 |
| ගෘහ භාණ්ඩ | වර්ෂ 6-10 |
| පොත්පත් හා ප්‍රකාශන | වර්ෂ 3 |

මිලදී ගත් වර්ෂයේදී හා විකුණන ලද වර්ෂයේදී පාවිච්චි කරන ලද කාලයට අනුරූපව ක්ෂය ගණනය කරන අතර මිලට ගත් මාසයේදී මුළු මාසයටම ක්ෂය ගණනය කරන නමුත් විකුණන මාසයට ක්ෂය ගණනය නොකෙරේ. පොත්පත් හා සඟරා හැර වටිනාකම රු. 7,500/ ට අඩු සියළුම අයිතමයන්, ගිණුම්කරණ ප්‍රමිති, විගණන ප්‍රමිති හා වටිනාකම රු. 1,000/ ට අඩු අනෙකුත් ප්‍රකාශන, මිලට ගත් වර්ෂ තුළදීම වියදමක් ලෙස සලකනු ලැබේ.

**තොග**

තොග අගය කරන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකමෙන් අඩු අගයටය. තොග පිරිවැය තීරණය කරන්නේ ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් (ප්‍ර.ලැ.ප්‍ර.නි) පදනම අනුවය.

**ලැබිය යුතු දෑ**

සියළුම ලැබිය යුතු දෑ ඒවා උපලබ්ධි වේ යැයි ඇස්තමේන්තුගත අගයට දක්වන අතර, බොල් සහ අඩමාන ණය සඳහා වෙන්කිරීම් අවශ්‍යතාවය අනුව කරනු ලැබේ.

### මුදල් හා මුදල් සමාන දෑ

බැංකුවේ සහ අතැති මුදල් සහ කල්පිරෙන දින තෙක් ඇති කෙටිකාලීන තැන්පතු, ඒවායේ පිරිවැයට දැක්වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල් සහ බැංකු තැන්පතුවලින් බැංකු අයිරා හිලව් කිරීමෙනි.

### ගෙවිය යුතු දෑ

ගෙවිය යුතු දෑ සඳහා වගකීම්, ගෙවීමට බලාපොරොත්තු වන මුදල් සහ මුදල් සමාන දෑ වල වටිනාකමට දැක්වේ.

### විශ්‍රාම ප්‍රතිලාභ

1983 අංක 12 දරන සේවක පාරිතෝෂික පනත අනුව ගෙවිය යුතු පාරිතෝෂික සඳහා වෙන්කිරීම් මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශනයේ කර ඇත්තේ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වල වර්තමාන අගය මත පදනම්වය.

සියලු ආයුගණක ලාභයන් හෝ අලාභයන් මූල්‍ය කාර්ය සාධනය හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දක්වා ඇත.

### රාජ්‍ය ප්‍රදාන

ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාරයෙන් ලද රාජ්‍ය ප්‍රදාන ආදායමක් ලෙස හඳුනාගන්නේ අදාළ වියදම හඳුනාගනු ලබන කාලපරිච්ඡේදයේදීමය.

ඉදිරි කාලපරිච්ඡේදයක් තුළ වියදමක් වන වත්කම් අත්පත් කරගැනීම සඳහා භාවිතා කරනු ලබන රාජ්‍ය ප්‍රදාන විලම්බිත ආදායම් ලෙස හඳුනාගනු ලැබේ. මුදල් සහ මුදල් හා සමාන දෑ ඇතුළු අනෙකුත් වත්කම් වලින් වගකීම් (ලැබුණු රාජ්‍ය ප්‍රදාන වලට අදාළ වගකීම් හැර) අඩු කල විට නිරූපණය වන රාජ්‍ය ප්‍රදාන වගකීමක් ලෙස හඳුනාගනු ලැබේ.





### 3. දේපළ, පිරියත හා උපකරණ

| | මෝටර් වාහන | | කාර්යාල උපකරණ | | ලී බඩු සහ සවිකිරීම් | | පුස්තකාල පොත් | | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2016 දෙසැ. 31 රු. | 2015 දෙසැ. 31 රු. | 2016 දෙසැ. 31 රු. | 2015 දෙසැ. 31 රු. | 2016 දෙසැ. 31 රු. | 2015 දෙසැ. 31 රු. | 2016 දෙසැ. 31 රු. | 2015 දෙසැ. 31 රු. | 2016 දෙසැ. 31 රු. | 2015 දෙසැ. 31 රු. |
| **පිරිවැය** | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 43,770,000 | 45,070,000 | 9,360,745 | 8,770,395 | 10,630,338 | 9,865,503 | 3,126,300 | 3,121,800 | 66,887,383 | 66,827,698 |
| එකතු කිරීම් | 7,390,000 | | 1,125,835 | 590,350 | 499,926 | 764,835 | 64,599 | 4,500 | 9,080,360 | 1,359,685 |
| බැහැර කිරීම් | | (1,300,000) | (1,476,960) | | | | | | (1,476,960) | (1,300,000) |
| මාරු කිරීම් | | | (25,623) | | 25,623 | | | | | |
| වර්ෂය අවසානයේ ශේෂය | 51,160,000 | 43,770,000 | 8,983,997 | 9,360,745 | 11,155,887 | 10,630,338 | 3,190,899 | 3,126,300 | 74,490,783 | 66,887,383 |
| **සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 15,253,500 | 7,799,499 | 8,034,715 | 7,208,698 | 9,631,099 | 9,431,342 | 3,093,729 | 3,038,145 | 36,013,043 | 27,477,684 |
| වර්ෂය තුළ ක්ෂය වියදම් | 8,357,165 | 8,754,000 | 860,722 | 826,017 | 2,57,851 | 199,757 | 43,379 | 55,584 | 9,519,116 | 9,835,358 |
| ඉවත් කිරීම් මත ක්ෂය | | (1,299,999) | (1,476,953) | | | | | | (1,476,953) | (1,299,999) |
| වර්ෂය අවසානයේ ශේෂය | 23,610,665 | 15,253,500 | 7,418,484 | 8,034,715 | 9,888,950 | 9,631,099 | 3,137,108 | 3,093,729 | 44,055,206 | 36,013,043 |
| වර්ෂය අවසානයේ ලියා හරින ලද අගය | 27,549,335 | 28,516,500 | 1,565,513 | 1,326,030 | 1,266,937 | 999,239 | 53,791 | 32,571 | 30,435,576 | 30,874,340 |

| දිනට | 2016 දෙසැ. 31 | 2015 දෙසැ. 31 |
|---|---|---|
| **4. තැන්පතු (ජංගම නොවන)** | | |
| ජංගම නොවන | 6,879,736 | 5,138,775 |
| **5. තොග** | | |
| ලිපි ද්‍රව්‍ය | 576,864 | 521,125 |
| **6. ලැබිය යුතු දෑ** | | |
| ඉදිරියට කළ ගෙවීම් | 3,147,666 | 1,789,420 |
| තැන්පතු | 30,000 | 80,000 |
| | 3,177,666 | 1,869,420 |
| **7. මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| බැංකුවේ සහ අතැති මුදල් | 2,110,767 | 1,492,926 |

| දිනට | 2016 දෙසැ. 31 රු. | 2015 දෙසැ. 31 රු. |
|---|---|---|
| **8. විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම නොවන)** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 36,272,974 | 41,516,827 |
| ජංගම නොවන වත්කම් අත්පත් කරගැනීම සඳහා ලැබුණු හා වැයකල ප්‍රදාන | 1,690,360 | 1,359,685 |
| ජංගම නොවන වත්කම් ලෙස ලැබුණු රාජ්‍ය ප්‍රදාන | 7,390,000 | |
| පාරිතෝෂික අරමුදලේ ආයෝජනය කරන ලද රාජ්‍ය ප්‍රදාන | | 2,700,000 |
| තැන්පතු වැඩිවීම (ජංගම නොවන) | 1,740,960 | |
| වර්ෂය සඳහා ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | (9,519,116) | (9,835,358) |
| පාරිතෝෂික අරමුදලෙන් ලැබු පොළිය | 358,981 | 93,172 |
| කාර්යාල උපකරණ ඉවත්කිරීමේදී වූ අලාභය | (7) | (1) |
| සේවක ප්‍රතිලාභ වගකීම්වල වසරේ වෙනස්වීම් | (725,298) | 438,649 |
| වර්ෂය අවසානයේ ශේෂය | 37,208,854 | 36,272,974 |
| **නියෝජනය වන්නේ** | 30,435,576 | 30,874,340 |
| දේපළ පිරියත හා උපකරණ | 6,879,735 | 5,138,775 |
| තැන්පතු (ජංගම නොවන) | (106,458) | 259,859 |
| පාරිතෝෂික අරමුදලේ අතිරික්තය / (පාරිතෝෂික වෙන්කිරීම්) | 37,208,854 | 36,272,974 |
| **9. නිශ්චිත ප්‍රතිලාභ වගකීම්** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 3,992,430 | 4,431,079 |
| වසර තුල ප්‍රතිපාදන | 574,972 | 429,260 |
| වසර සඳහා පොළිය | 483,483 | 467,313 |
| ආයුගණක ලාභ/පාඩු | (333,157) | (1,335,222) |
| | 4,717,728 | 3,992,430 |
| වර්ෂය තුළ ගෙවීම් | | |
| | 4,717,728 | 3,992,430 |
| පාරිතෝෂික අරමුදල (සටහන් 9.1) | (4,611,270) | (4,252,289) |
| වර්ෂය අවසානයේ ශේෂය | 106,458 | (259,859) |
| ප්‍රතිපාදනයේ වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී පහත සඳහන් උපකල්පන භාවිතා කර ඇත. | | |
| අපේක්ෂිත වේතන වැඩිවීම | 10% | 10% |
| වට්ටම්/පොලී අනුපාතය | 12.11% | 10.94% |
| සේවක පිරිවැටුම් අනුපාතය | 9% | 9% |

පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන බාහිර අරමුදල් මගින් සම්පාදනය වී ඇත



මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

| දිනට | 2016 දෙසැ. 31 රු. | 2015 දෙසැ. 31 රු. |
|---|---|---|
| **9.1 පාරිතෝෂික අරමුදල** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 4,252,289 | 1,459,117 |
| වසර තුළ සිදුකරන ලද ආයෝජන | | 2,700,000 |
| වසර තුළ ඉපයූ පොළිය | 358,981 | 93,172 |
| වර්ෂය තුළ කරන ලද ගෙවීම් | | |
| වර්ෂය අවසානයේ ශේෂය | 4,611,270 | 4,252,289 |
| **10. විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රධාන (ජංගම)** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 923,935 | (1,313,552) |
| තොග සහ ලැබිය යුතු දෑ වල වැඩිවීම්/(අඩුවීම්) | 1,363,985 | 173,401 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල වැඩිවීම්/(අඩුවීම්) | 617,841 | 568,972 |
| ගෙවිය යුතු දෑ වල වැඩිවීම්/(අඩුවීම්) | (615,290) | 1,495,114 |
| වර්ෂය අවසානයේ ශේෂය | 2,290,471 | 923,935 |
| **නියෝජනයවන්නේ -** | | |
| තොග | 576,865 | 521,125 |
| ලැබිය යුතු දෑ | 3,177,666 | 1,869,420 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 2,110,767 | 1,492,926 |
| අඩුකලා: ගෙවිය යුතු දෑ | (3,574,826) | (2,959,536) |
| | 2,290,471 | 923,935 |
| **11. ගෙවිය යුතු දෑ** | | |
| විගණකවරුන්ගේ පාරිශ්‍රමික | 160,000 | 150,000 |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට ගෙවිය යුතු ප්‍රදාන | | 1,250,000 |
| සමාලෝචකයින් සඳහා ගෙවිය යුතු වෘත්තීය ගාස්තු | 230,000 | 110,000 |
| ගෙවිය යුතු කාර්ය මණ්ඩල දිරි දීමනා | 1,014,000 | 949,000 |
| වෙනත් ගෙවිය යුතු දෑ | 2,170,826 | 500,536 |
| | 3,574,826 | 2,959,536 |

| දිනට | 2016 දෙසැ. 31 රු. | 2015 දෙසැ. 31 රු. |
|---|---|---|
| **12. රාජ්‍ය ප්‍රදාන** | | |
| වර්ෂය තුළ ලැබුණු රාජ්‍ය ප්‍රදාන | 75,099,770 | 67,317,275 |
| ධාරිතාව වර්ධනය සඳහා වර්ෂය තුළ ලැබුණු විශේෂ රාජ්‍ය ප්‍රදාන | 23,420,000 | |
| ජංගම නොවන වත්කම් ලෙස ලැබුණු රාජ්‍ය ප්‍රදාන | (7,390,000) | |
| කුලී තැන්පතු වැඩිකිරීම් සඳහා යෙදවූ රාජ්‍ය ප්‍රදාන | (1,740,960) | |
| ප්‍රාග්ධන වියදම් සඳහා යෙදවූ ප්‍රදාන | (1,690,360) | (1,359,685) |
| පාරිතෝෂික අරමුදල් සඳහා ආයෝජනය කළ ප්‍රදාන | | (2,700,000) |
| ශුද්ධ ජංගම වත්කම් සඳහා වැය කල ප්‍රදාන | (1,366,536) | (2,237,486) |
| වර්ෂය සඳහා ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් | 9,519,116 | 9,835,358 |
| පාරිතෝෂික අරමුදලින් ලැබූ පොළිය | (358,981) | (93,172) |
| කාර්යාල උපකරණ ඉවත්කිරීමේදී වූ අලාභය | 7 | |
| වර්ෂය සඳහා නිශ්චිත ප්‍රතිලාභ වගකීම් | 1,058,455 | 896,573 |
| මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ දැක්වෙන ප්‍රදාන | 96,550,511 | 71,658,863 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් තුල දැක්වෙන නිශ්චිත ප්‍රතිලාභ වගකීම් යලි ගණනය කිරීම සම්බන්ධ ප්‍රදාන | (333,157) | (1,335,222) |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වෙන මුළු විස්තීර්ණ ආදායම්වලට මාරු කරන ලද මුළු ප්‍රදානයන් | 96,217,354 | 70,323,641 |
| **13. විගණකවරුන්ගේ පාරිශ්‍රමික** | | |
| වර්ෂයේ වියදම් | 160,000 | 150,000 |
| පසුගිය වසරේ (අධි) / ඌණ වෙන් කිරීම් | 3,180 | 46,242 |
| | 163,180 | 196,242 |
| **14. කාර්ය මණ්ඩල පිරිවැය** | | |
| කාර්ය මණ්ඩල පාරිශ්‍රමික | 16,367,231 | 16,492,887 |
| සේවක අර්ථසාධක අරමුදල | 2,166,026 | 2,142,546 |
| සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල | 541,506 | 535,638 |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් (සටහන 14.1) | 751,397 | 785,884 |
| වාහන කුලී හා රියදුරු ගෙවීම් | 1,001,901 | 771,915 |
| කාර්ය මණ්ඩල දිරි දීමනා | 11,921,000 | 11,561,767 |
| සෞඛ්‍ය රක්ෂණය | 528,243 | 418,977 |
| කාර්ය මණ්ඩල ශුභසාධනය | 719,984 | 611,299 |
| වෙනත් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ | 5,352,845 | 4,001,239 |
| | 39,350133 | 37,322,152 |
| **14.1 නිශ්චිත ප්‍රතිලාභ වගකීම්** | | |
| වර්ෂය සඳහා අය කිරීම | 574,972 | 429,260 |
| වර්ෂය සඳහා ශුද්ධ පොළිය | 176,425 | 356,624 |
| | 751,397 | 785,884 |
| වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස දක්වා ඇති ආයුගණක ලාභ / පාඩු | (333,157) | (1,335,222) |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අඩංගුවී ඇති මුළු නිශ්චිත ප්‍රතිලාභ වගකීම් | 418,240 | (549,338) |





| දිනට | 2016 දෙසැ. 31 රු. | 2015 දෙසැ. 31 රු. |
|---|---|---|
| **15. විශේෂ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් මත වියදම්** | | |
| කාර්යාල පරිශ්‍රය පුළුල් කිරීම | 627,297 | |
| සේවක මණ්ඩලය පුහුණුව | 10,678,146 | |
| විගණන සමාලෝචන වැඩමුළුව | 3,865,548 | |
| මූල්‍ය වාර්ථාකරන වැඩමුළු | 1,755,542 | |
| මහජනයා දැනුවත් කිරීම | 3,754,358 | |
| සමාලෝචකයින් පුහුණු කිරීම | 998,150 | |
| | 21, 679,041 | |
| **16. වෙනත් පරිපාලන වියදම්** | | |
| වාර්ෂික වාර්තා | 353,563 | 280,510 |
| පරිඝණක නඩත්තු වියදම් | 203,433 | 207,766 |
| උපකරණ නඩත්තු වියදම් | 186,861 | 357,876 |
| දුරකථන වියදම් | 584,959 | 560,610 |
| වාහන නඩත්තු වියදම් | 597,541 | 295,615 |
| කාර්යාල වියදම් | 462,159 | 328,739 |
| නෛතික හා වෘත්තියවේදී ගාස්තු | 331,200 | 13,800 |
| අභ්‍යන්තර විගණන ගාස්තු | 156,500 | 146,686 |
| වෙනත් වියදම් | 602,109 | 652,849 |
| | 3,478,325 | 2,844,451 |

**17. ප්‍රාග්ධන වගකීම්**

2017 ජනවාරි 01 වන දින සිට කුලියට ගන්නා ලද නව කාර්යාල පරිශ්‍රයේ අභ්‍යන්තර සැලසුම් හා ඉදිකිරීමේ කටයුතු සිදුකිරීම සඳහා මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත් මේ සඳහා මේ වනතෙක් බැරකම් වලට එළඹී නොතිබිණ. (2015 දෙසැම්බර් 31 ට නැත)

**18. අසම්භාව්‍ය බැරකම්**

2016 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය බැරකම් කිසිවක් නොමැත. (2015 දෙසැම්බර් 31 ට නැත)

**19. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනෙන් පසු සිදුවූ සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශනයන්හි ගැලපීම් සිදුකිරීමට හෝ හෙළිදරව් කිරීමට තරම් ප්‍රමාණාත්මක සිදුවීම් කිසිවක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනෙන් පසු සිදුවී නොමැත.

# නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්

පනත සහ පනත් යටතේ ඇති නීතිරීති ප්‍රකාර පහත සඳහන් ආයතන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස නිර්වචනය කර ඇත.

- ★ බලපත්‍රලාභී බැංකු.
- ★ රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යෑම සඳහා බලය පවරන ලද සමාගම්.
- ★ කල් බදු ව්‍යාපාර කටයුතු වල නිරත වී සිටින සමාගම්.
- ★ ණය එකතුකිරීමේ සමාගම්.
- ★ මූල්‍ය සමාගම්.
- ★ ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් ලෙස හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යෑමට බලය පැවරූ සමාගම්.
- ★ ඒකක භාර ක්‍රියාක්මක කිරීම සඳහා බලයලත් සමාගම්.
- ★ අරමුදල් කළමනාකරණ සමාගම්.
- ★ කොටස් හුවමාරුවක් ලෙස ක්‍රියාත්මකවීමට බලයලත් සමාගම්.
- ★ කොටස් වෙළඳපලේ ලැයිස්තුගත සමාගම්.

- ★ අනෙකුත් සමාගම්
  - (අ) රුපියල් මිලියන 500 කට වැඩි පිරිවැටුමක් ඇති සමාගම්;
  - (ආ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී කොටස් හිමියන්ගේ ස්කන්ධය රුපියල් මිලියන 100 කට අධිකව තිබූ සමාගම්;
  - (ඇ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී දළ වත්කම් රුපියල් මිලියන 300 කට අධිකව තිබූ සමාගම්;
  - (ඈ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී බැංකුවලට සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට රුපියල් මිලියන 100 කට වැඩි බැරකම් පැවති සමාගම්;
  - (ඉ) කාර්ය මණ්ඩලයේ සේවකයින් සංඛ්‍යාව 1,000 කට අධික සමාගම්;

- ★ භාණ්ඩ අලෙවියෙහි හෝ සේවා සැලසීමෙහි නියුක්ත රාජ්‍ය සංස්ථා.

- ★ ඉහත සඳහන් වර්ග වලින් කවර හෝ වර්ගයකට වැටෙන එක් සමාගමක් ඇතුළත් සමාගම් සමූහයක්. මෙම කාර්යය සඳහා සමාගම් සමූහය යන්නෙන්, සමාගම් පනත යටතේ ස්වකීය ගිණුම් ඒකාබද්ධ කළ යුතු පාලක සමාගමක් හා එහි පාලිත සමාගම් අදහස් වේ.

# සටහන්

**ආයතනයේ නම**

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

**නෛතික තත්ත්වය**

1995 අංක 15 දරන පනත අනුව
සංස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත
මණ්ඩලයකි

**සංස්ථාපිත කරන ලද රට**

ශ්‍රී ලංකාව

**ප්‍රධාන කාර්යාලය**

3 වන මහල
293, ගාලු පාර,
කොළඹ 3

දුරකථන අංකය: 011 2301210
ෆැක්ස්: 011 2301211
විද්‍යුත් තැපෑල: slaasmb@sltnet.lk
වෙබ් අඩවිය: www.slaasmb.gov.lk

**විගණකවරුන්**

**බාහිර විගණක**

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල

**අභ්‍යන්තර විගණක**

එදිරිසිංහ සහ සමාගම
වරලත් ගණකාධිකාරීවරු
45, බ්‍රේබෲක් පෙදෙස,
කොළඹ 2

**බැංකු**

ලංකා බැංකුව

**නීති උපදේශකවරු**

නීතිපතිතුමා
නීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 10

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන
ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

3 වන මහල, 293, ගාලු පාර, කොළඹ 3
ශ්‍රී ලංකාව.